වෙනස
තීන්දුවට පෙර අවධානයට

මැයි 19 වැනිදා මන්නාරම ප්‍රෙද්ශයේ පැවති කොටි සැමරුමක්

දේශීය විප්ලවයෙන් පසු ශ්‍රී ලංකාව

ජනවාරි අට වැනිදා සිදුවූ බල පෙරළිය විප්ලවයක් ලෙස හඳුන්වන පිරිසක් බල පෙරළියෙන් මාස හයකට පසුවත් අප අතර සිටිති. ඉතා සරල අරුතින් ගතහොත් විප්ලවය යනු කිසියම් වෙනසක් සිදුවූ බව හැඟවීම සඳහා යෙදෙන පදයකි. මැතිවරණයට පෙර මෙම විප්ලවය දියත් කළ බලවේගයේ ප්‍රධාන සටන් පාඨය වූයේද වෙනසය. දින සීයෙන් අලුත් රටක් යනුවෙන් රට පුරා ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කෙරිණි. ජනවරම පාවා නොදෙනු.... ජනවාරි අට විප්ලවය රැක ගනිමු... ආදී සටන් පාඨ තවමත් අසන්නට ලැබේ. එහෙයින් මේ වෙනස කුමක්ද යන්න විමසා බැලීම කාලීන අවශ්‍යතාවයකි.

❑ මෛත්‍රිපාල සිරිසේන මහතා මෙරට 6 වැනි විධායක ජනාධිපති ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව ස්වකීය යහපාලනය ආරම්භ කරන ලද්දේම ව්‍යවස්ථා විරෝධී ආකාරයට රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ධුරයට පත් කරමිනි. ජනවාරි අට වැනිදා පැවතියේ ජනාධිපතිවරණයක් මිස මහ මැතිවරණයක් නොවේ. අගමැතිවරයා පත්කරනු ලබන්නේ පාර්ලිමේන්තු මැතිවරණයකින් පසු බහුතර මන්ත්‍රීවරුන්ගේ ප්‍රසාදය දිනාගත හැකි යැයි ජනාධිපතිවරයාට හැඟෙන පුද්ගලයාය. එජාපයට එවැනි පාර්ලිමේන්තු බලයක් නොතිබූ අතර අගමැතිවරයෙක් සිටියදී තවත් අගමැතිවරයකු පත් කිරීමේ සම්ප්‍රදායද නීති විරෝධී බව හිටපු අගවිනිසුරු සරත් එන් සිල්වා මහතා පෙන්වා දී තිබේ.

❑ විධායක සභාව නමින් කැබිනට්ටුවටත් ඉහලින් පවතින ව්‍යවස්ථා විරෝධී ආයතනයක් පිහිටුවා ඒ හරහා රටේ වැදගත් කාරණා සම්බන්ධව පවා තීන්දු ගන්නා තත්ත්වයක් ඇති කෙරෙණි.

❑ කැනඩාවේ කොටි ඒජන්ත රාජරත්නම්ගේ මුදල් ලංකාවට හොරෙන් ගෙන ඒමට සහය වූ බව කියන රවී කරුණානායක මහතා 2015. 01. 11 දින මුදල් ඇමැති වශයෙන් පත් කෙරිණි. ඒ වන විට ලක් සතොස ආයතනය බංකොලොත්වීමට අදාළ සිදුවීම් මුල් කර ගනිමින් රවී කරුණානායක මහතාට එරෙහි නඩුවක් ද අධිකරණයේ විභාග වෙමින් තිබේ.

❑ 2015. 01. 28 වන දින අගවිනිසුරු මොහාන් පීරිස් මහතා නීති විරෝධී අන්දමට ධුරයෙන් පහ කෙරිණි. ඒ වන විට දෝෂාභියෝගයක් මගින් විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ධුරයෙන් ඉවත් කර තිබූ හිටපු අගවිනිසුරුවරිය නැවත ධුරයේ පිහිටවනු ලද්දේ කිසිදු විධිමත් ක්‍රමවේදයකින් තොරවය. හිටපු අගවිනිසුරුවරිය ඉවත් කිරීම සම්බන්ධව කුමන ආචාර ධාර්මික අර්ථ නිරූපන තිබුණද එම ඉවත්කිරීමේ ක්‍රියාවලිය ව්‍යවස්ථානුකූල රාමුවක් තුළ සිදුවූවකි.

❑ 2015. 01.30 දින අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයට කඩා වැදුණු එජාප මැරයන් විසින් කළ බාධා කිරීම් හේතුවෙන් අධිකරණ කටයුතු අතරමඟ නතර කිරීමට මහෙස්ත්‍රාත්වරයාට සිදු විය.

❑ එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත තෙවරප්පෙරුම විසින් එජනිස ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු අගලවත්තේදී දණ ගස්වා පහරදීමද යහපාලන රජය බලයට පත් වූ සැණින් දක්නට ලැබුණු සුවිශේෂී සිද්ධියකි. එමෙන්ම නීතිය හා සාමය භාර ජෝන් අමරතුංග ඇමැතිවරයාගේ ආධාර කරුවන් වත්තල ප්‍රාදේශීය සභා රැස්වීමට කඩා පැන එහි සභාපතිවරයාට හා මන්ත්‍රීවරුන් දෙදෙනකුට පහර දීමක් සහ පී. හැරිසන් ඇමැතිවරයාගේ ආධාර කරුවන් තලාව පොලිසියේ පොලිස් නිලධාරීන් දෙදෙනකුට ද පහරදුන් සිදුවීමක් අසන්නට ලැබිණි.

❑ ජනතා විමුක්ති පෙරමුණ 2015. 02. 06 වන දින කොළඹ නව රුසියානු තානාපති කාර්යාලයට කඩා වැදී සත්‍ය චෝදනා නගමින් ඊට අලාභ හානි සිදු කළේය.

2 වැනි පිටුවට

1 වැනි පිටුවෙන්...

දේදුනු විප්ලවයෙන් පසු ශ්‍රී ලංකාව

- 2015 ජනවාරි 22 වැනිදා ටෙලිකොම් සභාපති ලෙස අධික වැටුපකට ජනාධිපතිවරයාගේ සොහොයුරෙකු පත් කෙරුණු අතර ඒ අන්දමට ඥාති සම්බන්ධතා ආදිය මත පත්වීම් ලබාදීමේ සිදුවීම් බහුලව අසන්නට ලැබිණි. මේ පිළිබඳ තවත් අපූරු උදාහරණයක් වන්නේ රක්ෂණ සංස්ථාවේ කළමනාකරණ අධීක්ෂකවරයකු ලෙස රවි කරුණානායක ඇමතිවරයාගේ මස්සිනා කෙනෙකු වන විශ්‍රාමික පොලිස් සාජන්වරයෙකුට පත්වීමක් ලබාදීමය. ඔහුගේ මාසික වැටුප රුපියල් හය ලක්ෂයකි.

- මේ අන්දමට රට පුරා රාජ්‍ය ආයතන රැසකට අයථා ලෙස පත්වීම් ලබාදීමේ සිදුවීම් දහස් ගණනක් මේ වනවිට වාර්තා වී තිබේ. වඩා විශේෂිත කාරණයක් වන්නේ සාමාන්‍ය ක්‍රමයට සපුරා පටහැනිව පාර්ලිමේන්තු මැතිවරණය කැඳවීමෙන් පසුව පවා ඌව පළාත් සභාව ඇතුලු ආයතන ගණනාවක මේ අන්දමට රැකියා ලබා දීමය. උදාහරණයක් ලෙස මධ්‍යම ආණ්ඩුව යටතේ පවතින ජාතික පාසැල් සියල්ලටම කම්කරු පත්වීම් ලබා දී ඇත. ඒ එක් පාසැලකට පත්වීම් දෙක බැගින් බව මුලදී වාර්තා වුවද ඊට වඩා සැබෑ තත්ත්වය බොහෝ වෙනස්ය. මීගමුව හරිස්චන්ද්‍ර විද්‍යාලයට පමණක් කිසිදු පදනමකින් තොරව මෙවන් කම්කරු පත්වීම් දහයක් ලබා දී ඇති අතර ඒ පත්වීම්ලාභී සියලුම දෙනා අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ්ගේ කාර්යාලයේ මහතාගේ ගම් පලාතේ පදිංචි කාන්තාවන්ය.

- අයථා පත්වීම් ලබාදීම පමණක් නොව දේශපාලන බලපෑම් සහ පළිගැනීම් මත සිදුකළ රැකී රක්ෂා අහිමිකිරීම් මාරුකිරීම් සංඛ්‍යාවද අති විශාලය.

- මැතිවරණයට පෙර ලබා දුන් ආකර්ශනීය පොරොන්දු රාශියක් කඩ කිරීම හෝ ඒවා වංචනික ලෙස මඟහැර යාම ආණ්ඩුවේ නිත්‍ය පිළිවෙතක් බවට පත්ව ඇත. අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල පහත දැමීම, විශ්‍රාමිකයන්ට මාසික අතුරු දීමනාවක් ලබාදීම, සමෘද්ධි සහනාධාරය සීයට දෙසීයකින් ඉහල දැමීම, මහපොල ගිය්‍යාධාර වැඩි කිරීම, වී කිලෝවක් රුපියල් පහහට මිලදී ගැනීම, රබර් සඳහා රු. 350ක මිලක් පවත්වාගෙන යාම, ගොවිණය කපා දැමීම, උගස් කළ රන් භාන්ඩවල පොලිය හා දඩ මුදල් කපා දැමීම, මත්කුඩු මැඩලීමට විශේෂ බලකායක් පිහිටුවීම, කැසිනෝ බලපත් අවලංගු කිරීම ඒ ආකාරයට කඩවුණු පොරොන්දු ලයිස්තුවට ඇතුළත් කළ හැකි මූලික කාරණා කිපයකි.

- කැබිනට් ඇමතිධුර සංඛ්‍යාව පිළිබඳ ගැටලුවද කාලයක් තිස්සේම මෙරට දේශපාලනය තුළ වාද විවාද ගැටුම් රැසකට හේතු පාදක වූ මාතෘකාවකි. යහපාලන ආණ්ඩුව බලයට පත්වන්නේද අමාත්‍ය ධුර සංඛ්‍යාව 25ට අඩු කරන බවට පොරොන්දු ලබා දෙමිනි. එසේ වුවද දින සීය අවසාන වන විට අමාත්‍ය ධුර සංඛ්‍යාව 80ක් පමණ වූ අතර, මේ ඇමති ධුර ප්‍රායෝගිකව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට ප්‍රමාණවත් නොවන කෙටි කාලයක් සඳහා ලබා දුන් ඒවා වීමද මෙම ආණ්ඩුවේ අත්තනෝමතික බව පෙන්වන සාධකයකි.

- වංචා දූෂණ ආදිය නතර කොට සිදුවෙමින් පවතින සංවර්ධන කටයුතු දස ගුණයකින් වේගවත් කරන බව මැතිවරණයට පෙර පැවසුවද, අද වනවිට සංවර්ධන ව්‍යාපෘති මුළමනින්ම පාහේ නතර වී තිබේ. ඒ තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් සේවා හා සම්බන්ධ ආයතන රාශියක් හා ඒවායේ සේවය සේවක පිරිස් අති විශාල ප්‍රමාණයක් දුෂ්කරතා රැසකට මුහුණ පා සිටිති.

- මැතිවරණයට පෙර වත්මන් ජනාධිපතිවරයා කියා සිටියේ ඖෂධ පනතට එරෙහිව ඖෂධ සමාගම් හාරසියයක් විසින් ලබා දුන් අල්ලස් මුදල් මත එම පනත අතුරුදන් වීම සිදුවූ බවය. නමුත් බලය ලබා ගැනීමෙන් පසුව මෙම සමාගම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම තියා එම ප්‍රශ්නය ගැන කතාකිරීමද මේ වන විට මුළමනින්ම පාහේ නතරව තිබේ.

- සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය වෙනුවට තෝරු මෝරුන්ට රිංගා යා හැකි අන්දමේ ඖෂධ පනතක් ගෙන ඒමට වත්මන් ආණ්ඩුව සූක්ෂම වූ අතර එම පනත කඩිමුඩියේ පාර්ලිමේන්තුවේ සම්මත කරගන්නා ලද්දේ ඒ පිළිබඳ වැදගත් විවාදයක් ඇති වීමට තිබෙන ඉඩකඩ මුළමනින්ම පාහේ වලකලමිනි.

- මහා පරිමාණ දූෂණ වංචා හොරකම්වලට සම්බන්ධ පුද්ගලයන් අත්අඩංගුවට ගෙන දඬුවම් පැමිණවීම

මැතිවරණයට පෙර ආණ්ඩුව විසින් වඩාත් ඝෝෂාකාරී ලෙස භාවිතා කළ සටන් පාඨයක් වුවද බලය ලබා ගැනීමෙන් අනතුරුව එය මුළමනින්ම විහිළුවක් බවට පත්විය. අත්අඩංගුවට ගැනීමක් තියා දූෂකයන් කවුද? දූෂණ හෝ හොරකම් මොනවාද? යන කාරණා ගැන කිසිදු විද්‍යගත් හෙළිදරව්වක් හෝ කිරීමට ආණ්ඩුව අසමත් වූ අතර හොරු මැඩලීමේ මෙහෙයුම ආණ්ඩුව ප්‍රධාන වශයෙන්ම දියත් කරන ලද්දේ තම දේශපාලන විරුද්ධවාදීන් මර්දනය කිරීමේ අරමුණ පෙරදුරි කර ගනිමිනි. ඒ සඳහා මූල්‍ය අපරාධ කොට්ඨාශට නමින් නිතියට පටහැනි ආයතනයක්ද පිහිටුවා ගැනිනි. බලවත් අයථා ක්‍රියා සහ අපරාධවලට සම්බන්ධ බව කියවෙන අපකීර්තිමත් දේශපාලඥයන් පවා යහපාලන ආණ්ඩුවේ කොටස්කරුවන් බවට පත්කර ගැනුනු අතර දේශපාලන වශයෙන් තමන්ට එරෙහි වන්නන් ඉතා සරල කාරණා මත පවා අත්අඩංගුවට ගැනීම්, ප්‍රශ්න කිරීම්, හා මාධ්‍ය ඔස්සේ අපවාදයට ලක්කිරීම් සිදුකෙරිණි.

- අධිවේගී මාර්ග කිලෝ මීටරයක් ඉදි කිරීම සඳහා වැයවන මුදල පිළිබඳ ප්‍රශ්න කරමින් පැවති රජයට පහරදීම ජනාධිපතිවරණයට පෙර සුලබ දෙයක් බවට පත්ව තිබිණි. එහෙත් යහපාලකයෝ අද කඩවත කෙරවලපිටිය අතර අධිවේගී මාර්ගයේ කිලෝ මීටරයක් ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 7.5ක් හෙවත් ඉතිහාසයේ ඒ සඳහා වූ වැඩිම මුදල වැය කිරීම වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර තිබේ.

- කුඩු සහ එතනෝල් සම්බන්ධව ආණ්ඩුවේ ප්‍රතිපත්තියද මීට මුළමනින්ම සමානය. ඡන්දයට පෙර ඔවුන් රාජපක්ෂ ආණ්ඩුව හඳුන්වන ලද්දේ කුඩු, කැසිනෝ, එතනෝල් සන්ධානය වශයෙනි. එය මැතිවරණ ව්‍යාපාරයේ බලවත් සටන් පාඨයක් වූ අතර කුඩු ගෙන්වීමට ආණ්ඩුවේ දේශපාලඥයන් සම්බන්ධ බව නිතර කියැවිනි. විනාවක් මේ කුඩු කාරයන් කවුදැයි නම් කරන ලෙස රූපවාහිනී සංවාදයකදී අභියෝග කිරිකීමෙන් අනතුරුව විජේදාස රාජපක්ෂ මහතා කියා සිටියේ එය ප්‍රසිද්ධියේ මාධ්‍යයක කිව නොහැකි වුවත් තමන් බලයට ආපසු ඒ ගැන නිසි ක්‍රියාමාර්ග ගත හැකි බවය. නමුත් යහපාලන ආණ්ඩුව බලයට ඒමෙන් පසුව මේ කුඩු වෙළඳාමට සම්බන්ධ කිසිදු දේශපාලඥයෙක් අත්අඩංගුවට ගැනීම හෝ අඩු තරමේ ඔවුන් කවුදැයි හෙළිදරව් කිරීමක් හෝ අද දක්වා සිදුව නැත. ඒ වෙනුවට කුඩු ජාවාරමට සම්බන්ධ බව කියැවෙන පුද්ගලයන්ට ආසන සංවිධායක ධුර පිරිනැමීම ආදිය සිදුකෙරිණි. කුඩු කන්ටේනරයක් නිදහස් කර යැවූ බවට ඔවුන් විසින්ම චෝදනා කළ හිටපු අගමැති දිමු ජයරත්න මහතා වත්මන් ජනාධිපතිවරයාගේ උපදේශකයෙක් ලෙස පත් කර ගත්තේය.

- එතනෝල් විරෝධයද ජනාධිපතිවරණ වේදිකාවේ ජනප්‍රිය සටන් පාඨයක් වුවද අලුත් ආණ්ඩුව යහපාලන රෙජිමය පිහිටුවා මාස 6ක් තුළ අලුතින් එතනෝල් ආනයන බලපත්‍ර 26ක් ලබා දී එතනෝල් මිලි ලීටර් ලක්ෂ 13.9ක් රටට ගෙන්වා තිබේ. එහෙත් 2014 වසර තුළ රටට ගෙන්වා ඇති මුළු එතනෝල් ප්‍රමාණය මිලි ලීටර් ලක්ෂ 14.7කි. මීට පෙර බලපත්‍ර 21ක් එනම් වැඩිම එතනෝල් බලපත්‍ර ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ ප්‍රේමදාස පාලන සමයේ දී ය.

- එන්ජීඕ සංවිධාන හා සම්බන්ධ පුද්ගලයන් හා එම මතවාද දරන පිරිස්වලට නව රජය යටතේ විශාල රාජ්‍ය අනුග්‍රහයක් සැපයිනි. ඔවුන්ට විවිධ තනතුරු ලබාදීම, රජය හා සම්බන්ධ කටයුතුවලට බාධාවකින් තොරව ඇඟිලි ගසන්නට ඉඩලබාදීම, මාධ්‍ය ඔස්සේ එම පුද්ගලයන්ගේ විපරීත අදහස් සඳහා කවරදාකවත් නොමැති තරමේ ඉඩක් ලබාදීම යහපාලනයේ කැපී පෙනෙන ලක්ෂණයක් විය. විනාවක් එවැනි මත දරන කලාකරුවන් කීපදෙනෙක් තමන් සහභාගි ව සිටි රූපවාහිනී වැඩසටහනක් අතරමග නවතා නැඟිට ගියේ ජනාධිපතිවරයා ආගම ඇදගීම රූපවාහිනියේ පෙන්වීම ගැන විරෝධය පළ කරමිනි.

- ලංකා ඉතිහාසයේ ලොකුම මූල්‍ය වංචාව ලෙස සැලකෙන බැඳුම්කර වංචාව සිදුවූයේද යහපාලන ආණ්ඩුව යටතේය. එයින් රජයට සිදුවූ පාඩුව රුපියල් කෝටි 6000කට ආසන්නය. ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද්දේ මෙම බැඳුම්කර මගඩිය යට ගැසීමට සහ විශ්වාසභංග යෝජනා මඟහැර යාමට බව අමාත්‍ය චම්පික රණවක මහතා ටික දිනකට පෙර ආණ්ඩුවට චෝදනා කළේය. අද වනවිට ඊට අදාල කෝප් වාර්තාව නිකුත්ව ඇතත් එය ප්‍රසිද්ධ කිරීමට එරෙහිව වාරණ නියෝගයක් ගැනීමට ආණ්ඩුව කටයුතු කර තිබේ.

- මේ සියල්ල අතරේ දෙමළ බෙදුම්වාදී බලවේග නැවත වේගයෙන් හිස ඔසවන්නට විය. මැයි 18 වැනිදා අධිකරණ නියෝගද නොතකමින් උතුරු නැගෙනහිර ප්‍රදේශවල කොටි සැමරුම් ගණනාවක් පැවති අතර කොළඹදීද අලුත් පරපුර නැමති සංවිධානයක් විසින් යුධ ජයග්‍රහණයට අවමන් කෙරෙන උත්සවයක් සංවිධානය කළේය.

- මේ කිසිවක් ගැන නොතකා ජනවාරි අට විප්ලවයක් ගැන නන් දොඩවන පිරිසක් තවම අප අතර සිටිති. ඔවුන්ගේ සැබෑ අරමුණ විය හැක්කේ කුමක්දැයි සිතා බැලීම ඔබට භාරය.

රත්තනදෙණියේ මේධානන්ද හිමි

ඔබ කුමක්ද? අපක්ෂපාතීව විමසා බලමු

ආණ්ඩු මාරුව 1948 සිටම මේ රටට නුහුරු දෙයක් නොවේ. පසුගිය ජනවාරි අට වැනිදාද එවැනි බල හුවමාරුවක් සිදුවිය. එළඹෙන අගෝස්තු 17 වැනිදාට යෙදෙන තවත් බල හුවමාරු කිරීමේ අවස්ථාවක් මේ වනවිට අප ඉදිරියට පැමිණ ඇත. හුදු ආණ්ඩු මාරුවේ පුරුදු සෙල්ලමින් ඔබ්බට ගොස් මේ මොහොතේ ඇති දේශපාලන තත්ත්වය අප විසින් වටහා ගත යුත්තේ කෙසේද?

පසුගිය ජනවාරි අට වැනිදා පැවති ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ මහතා පරාජයට පත්විය. එම පරාජයට බලපෑ සාධාරණ හේතු ප්‍රමාණයක් පැවති බව ඇත්තක් වුවද, ඊට වඩා බලවත් ලෙස ක්‍රියාත්මක වූ අසාධාරණ දේශපාලන ව්‍යාපෘතියක්ද ඒ පසුපස පැවති බව අප විසින් අමතක කළ යුතු නැත. ආණ්ඩු විරෝධී පක්ෂ, ජාතිවාදී බෙදුම්වාදී බලවේග, එන්ජීඕ සංවිධාන, බටහිර තානාපති කාර්යාල, ඔත්තු සේවා ආදිය හරහා බලගැන්වුණු මේ ව්‍යාපාරය මැතිවරණයට බොහෝ කාලයකට පෙර සිටම ක්‍රියාත්මකව තිබූ එකකි. ඔවුන්ට මහින්ද රාජපක්ෂව නයාට අඳුකොල බඳු නායකයෙක් වීමට හේතු වූයේ අන් කිසිවක් නොව මහින්ද ඔවුන්ගේ සැලසුම් අභියෝගයට ලක් කළ නායකයකු වීම නිසාය. මහින්දගෙන් මේ පිරිසට එල්ල වූ ලොකුම ප්‍රහාරය වූයේ ඔවුන්ගේ නියෝග නොතකා කොටි තුස්තවාදය මුලිනුපුටා දැමීමය. මේ නිසාම කුමන ක්‍රමයකින් හෝ මහින්ද දේශපාලන පිටියෙන් ඉවත් කිරීමට මේ පිරිසට වුවමනා වූ අතර රූකඩ පොදු අපේක්ෂකයකු හා අතීත දූෂිතයන් රැසක් පිරිවරා ගත් යහපාලන නාටකය කරළියට එන්නේ ඒ අනුවය. ඒ ඔස්සේ කිසිදා මැතිවරණයකින් බලය ගත නොහැකි පුද්ගලයෙකු අද හොර පාරකින් රටේ අගමැති බවට පත්ව තිබේ. ඔහුගේ යහපාලනයේ තරම කුමක්දැයි අද වන විට ඉතා කෙටි කාලයක් තුළ රටේ ජනතාවට අවබෝධ වන්නට පටන්ගෙන ඇත. යහපාලනය යනු හුදු නාටකයක් බව වටහා ගැනීමට මේ අවුල විසින්ම අද අපට යම් මාවතක් පාදා දී තිබේ.

කුමන අඳුපාඩු මැද වුවද මහින්ද රාජපක්ෂ මහතාගේ පාලන කාලය සැලකිය හැක්කේ ගතවූ ඉතිහාසයට සාපේක්ෂව වඩා වර්ණවත් හා අභිමානවත් කාල පරිච්ඡේදයක් ලෙසය. යුධ ගැටුම් කලකෝලාහල ආදියෙන් තොරව, රට ගොඩනඟන බලාපොරොත්තුවේ දිශාවට පා තැබීමට ඒ යුගය තුළ අප සමත් වූ බව පක්ෂ භේදයකින් තොරව බොහෝ දෙනාට පිළිගත හැකි සත්‍යයක් වන්නේය. එසේ වුවද ලබාගත් රන් ආකරයට වඩා නොගැඹුණු යකඩ කෑල්ලක් ගැන වදවීම මිනිස් ස්වභාවයකි. ඒ නිසාමදෝ රාජපක්ෂ පාලනයේ පැවති යම් යම් දුර්වලතා, මෝඩකම් අතිශෝක්තියට නංවමින් අද වනවිට රටේ ගමන නැවතත් ඉතා බිහිසුණු මාවතකට හැරවීමකට රටට සතුරු බලවේග සමත්ව තිබේ. ජනවාරි අට විප්ලවයෙන් පසු යහපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය, දූෂණ වංචා මැඩලීම ආදී කතා හුදු විහිළු බවට පත් වීමෙන් නොනැවතී පරාජය කර තිබූ බෙදුම්වාදී න්‍යාය පත්‍රය අධි වේගයෙන් නැවත ඉදිරියට ඇදීමට පටන්ගෙන ඇත. ඉදිරි මැතිවරණය යනු අප තවදුරටත් මේ වංචාකාරී යහපාලන බලවේගය සමඟ පෙරට යන්නේද නැද්ද යන්න තීරණය කෙරෙන මැතිවරණයකි.

එහෙයින් අවසාන තීන්දුව ගැනීමට පෙර අපක්ෂපාතීව විමසා බැලිය යුතු කරුණු ගණනාවක් අප හමුවේ තිබේ. හුදු අතිශෝක්ති බොරු හෝ මවාපෑම්වලින් තොරව ඊට අදාල නිශ්චිත කරුණු කාරණා මේ ප්‍රකාශනය හරහා ඔබේ අවධානයට යොමු කිරීමට අප අදහස් කළේ දෛනික මැතිවරණ ඝෝෂාවෙන් වැසී යන සැබෑ දේශපාලන කාරණා රටේ අවධානයට ලක් විය යුතු නිසාය.

මෙහි මතුකරන කාරණා සැලකිල්ලෙන් හා විවෘත මනසින් අවධානයට ගන්නා ලෙස පාඨක ඔබෙන් ඉල්ලා සිටිමු. රටේ වත්මන් මොහොත මෙන්ම අමතක වූ අතීතයද නැවත සිහිපත් කරගනිමින් අනාගතය සඳහා නිවැරදි තීන්දුවක් ගැනීම ඔබට භාරය.

දායකත්වය

ඉසුරු ප්‍රසංග, අමරසිංහ කුඩගල්ආර, ජීවන්ත ජයතිස්ස, රත්තනදෙණියේ මේධානන්ද හිමි, නාමල් උඩලමත්ත, සුහාෂ් වික්‍රමගේ

යහපාලන වෙස් මුහුණ සහ බෙදුම්වාදී සැබෑ මුහුණ

ජනවාරි 8 වැනිදා සිදුවූ මහින්ද රාජපක්ෂ මහතාගේ පරාජය ලෝකය පුරාම පැතිරී සිටින දෙමළ ජාතිවාදී බෙදුම්වාදී බලවේග අමන්දානන්දයට පත් කළ පුවතක් වී තිබිණි. ජනවාරි 8 වැනිදායින් පසුව මෙරට බෙදුම්වාදී බලවේගද නව ජවයකින් නැගී සිටි අතර එතැන් සිට විග්නේශ්වරන් වැනි පුද්ගලයන්ගේ තර්ජන ගර්ජන ආදිය සුලබ දෙයක් බවට පත් විය. ඊට සමාගාමීව බෙදුම්වාදය සම්බන්ධව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය බෙහෙවින් ලිහිල්වීමෙන් නොනැවතී අද වන විට එය බෙදුම්වාදයට වරදාන වරප්‍රසාද ලබාදෙන තත්ත්වයක් දක්වා වැඩි දියුණු වී තිබේ. මේ ඒ පිළිබඳ උදාහරණ කීපයකි.

❑ පාප් වහන්සේ ලංකාවට පැමිණීම නිමිත්තෙන් 2015. 01. 13 වන දා වවුනියාවේ හා මන්නාරමේ දෙමළ කිතුණු බැතිමතුන් පිරිසක් ඊළාම් පෝස්ටර් ප්‍රදර්ශනය කළේය. ඊළාම් දේශයට පැමිණෙන පාප් වහන්සේ ගෞරවයෙන් පිළිගන්නා බව එම පෝස්ටර්වල සඳහන්ව තිබිණි.

❑ 2015. 01. 16 වන දින ටීඑන්ඒ බෙදුම්වාදීන්ට ලොකුම බාධාවක් වී සිටි උතුරේ ආණ්ඩුකාරවරයා වූ ජී. ඒ. චන්ද්‍රසිරි මහතා එම තනතුරෙන් ඉවත් කොට ඒ වෙනුවට රාජ්‍ය නොවන සංවිධාන ජාලයට නැටවිය හැකි පුද්ගලයකු එම තනතුරට පත් කෙරිණි.

❑ කොටි හිතවාදී දෙමළ් නෙට් වෙබ් අඩවියට පනවා තිබූ තහනම ඉවත් කෙරිණි.

❑ යහපාලන ආණ්ඩුව බලයට පත් වී සතියක් යාමට පෙර එනම් ජනවාරි 12 වන දින චාල්ස් ඥානකෝන් සහ කැලම් මැක්රේ ශ්‍රී ලංකාවට පැමිණියේය. චාල්ස් ඥානකෝන් යනු හිටපු විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් ඝාතන සිද්ධියට සම්බන්ධ කොටි ප්‍රබලයෙක් වන අතර කැලම් මැක්රේ යනු ශ්‍රී ලංකාවට එරෙහිව කිලින් ෆිල්ඩ් වැනි චිත්‍රපට තැනූ පුද්ගලයෙකි. ඔහු මෙම චිත්‍රපට බ්‍රිතාන්‍යයේ චැනල් ෆෝ නාලිකාව ඇතුළු යුරෝපා රටවල ප්‍රදර්ශනය කරමින් ලංකාවට එරෙහි විශාල ප්‍රචාරයක් ගෙන ගියේය.

❑ යාපනය ඉදුවිල් හින්දු විද්‍යාලයේ උත්සවයකට සහභාගි වූ උතුරු පළාත් මහ ඇමැති විග්නේශ්වරන් මහතා උතුරු නැගෙනහිර සිටින සෙබලුන් යුද අපරාධකරුවන් වන බැවින් හමුදාව එම ප්‍රදේශවලින් ඉවත් විය යුතු බව ප්‍රකාශ කළේ ය.

❑ ද්‍රවිඩ ජාතික සන්ධානයේ ශ්‍රීධරන් මගේ නායකයා වේවුපිල්ලේ ප්‍රභාකරන් යැයි ඉන්දීය එක්ස්ප්‍රස් පුවත්පත සමඟ සාකච්ඡාවක් පවත්වමින් ප්‍රකාශ කළේය.

❑ 2015 පෙබරවාරි උතුරු පළාත් සභාව මගින් ස්වයං පාලනයක් ලබාගැනීම සඳහා පනතක් සම්මත කර ගත්තේය. ස්වයං පාලනයට අමතරව ශ්‍රී ලංකාවට එරෙහි ජාත්‍යන්තර පර්යේෂණයක් අවශ්‍ය බවද එහි ඇතුළත්ව තිබිණි. ප්‍රභාකරන්ගේ සමීප ඥාතියෙකු වූ කේ. ජී. සිවාජිලිංගම් විසින් ඉදිරිපත් කළ මෙම යෝජනාවේ සිංහලයන් විසින් අතීතයේ සිටම දෙමළ ජනතාවට කළ හිංසා පිළිබඳ අතිශය සාවද්‍ය තොරතුරු රාශියක් සහ සමූල ඝාතන චෝදනාද ඇතුළත් කර තිබේ. ඒ හරහා ජාත්‍යන්තර පරීක්ෂණයක් ඉල්ලා සිටීමත්, ලංකාව පිළිබඳ අතිශය අසාධාරණ මතයක් ලෝකයට ගෙන යාමත් සිදුව ඇත.

❑ 2015. 02. 02 දින ඕමන්ත මුරපොළ හරහා පරීක්ෂා කිරීමකින් තොරව භාණ්ඩ ගෙන යාමට අවසර ලැබිණි. ඊට පෙර වෙඩි බෙහෙත්, රතිඤ්ඤා ආදී පුපුරණ ද්‍රව්‍ය උතුරට ගෙන යාම තහනම් කර තිබුණ ද වත්මන් රජය එම තහනම ඉවත් කිරීමට කටයුතු කළේ ය.

❑ වවුනියාවේදී පොලිස් මුර සංචාරයක නිරත භට පිරිසකට 2015. 02. 05 වෙනි දින වෙඩි ප්‍රහාරයක් එල්ල වූ අතර ආණ්ඩුව එය ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන පුවතක් සේ යටපත් කළේ ය.

❑ රනිල් වික්‍රමසිංහ අගමැති වීමෙන් අනතුරුව ඉන්දියාවේ එන්.ඩී.ටී.වී රූපවාහිනිය සමඟ කළ සාකච්ඡාවකදී කියා සිටියේ උතුරේ ස්වයං පාලනයක් ලබාදීමට තමා එකඟවන බවය. ඉඩම් හා පොලිස් බලතල සහිතව 13 වන සංශෝධනය ක්‍රියාත්මක කිරීම රනිල් වික්‍රමසිංහ මහතාගේ මතය බව එම වැඩසටහනේදී ඔහු ප්‍රකාශ කළේය.

❑ උතුරේ ඉඩම් අක්කර 1000ක් ඒවායේ මුල් පදිංචිකරුවන් වූ දෙමළ ජනතාව අතර බෙදා දුන් අතර ඉන් අක්කර 906ක් අධිආරක්ෂිත කලාප සඳහා වෙන් කර තිබූ ඉඩම් වේ. (2015. 04. 12 ලංකාදීප) උතුරේ ඉඩම් නිදහස් කිරීමේ උත්සවය ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහ රනිල්, චන්ද්‍රිකා, විග්නේශ්වරන් වැනි පිරිසකගේ ප්‍රධානත්වයෙන් මාර්තු 23 වන දින යාපනයේදී පැවැත්වේනි.

❑ මෙරට දෙමළ ජනතාවට ස්වාධීන දේශයක් පිහිටුවීම තම ඉලක්කය බව ද්‍රවිඩ් ජාතික ජනතා පෙරමුණේ නායක ගණේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් යාපනයේදී ප්‍රකාශ කළේය. වෙනම රාජ්‍යයක් මිස බලය බෙදීමක් අනවශ්‍ය බව එහිදී අවධාරණය කෙරිණි. (2015. 05. 06. දිවයින)

❑ ත්‍රිකුණාමල නගරයේ සහ වරායේ ආරක්ෂාව සම්බන්ධව පිහිටුවා තිබූ සාමපූර් හමුදා කඳවුර 2015 මැයි 7 වන දින ගලවා ඉවත් කරන ලදී. එවකට පැවති ආරක්ෂක අවශ්‍යතාවන් මත මෙම නාවික කඳවුර ගොඩ නගන්නේ 2006 - 2007 කාලයේදීය. උපාය මාර්ගික වශයෙන් මෙය සැලකෙන්නේ ඉතා වැදගත් කඳවුරක් ලෙසය. මෙම හමුදා කඳවුර ඉවත්කර ගන්නේ ජනතාව නැවත පදිංචි කිරීමේ අරමුණින් බව පැවසුනද එය ඉන්දියානු තාප බලාගාරයකට ලබාදීමේ සැලැස්මක් ඇති බව 2015. 05. 15 දිවයින කතුවැකිය මගින් හෙළිදරව් කළේය.

❑ මැයි 18 වැනිදා කොටි සංවිධානයේ පරාජය අනුස්මරණය කෙරෙණ කොටි සැමරුම් රාශියක් උතුරු නැගෙනහිර දෙපළාත පුරා පැවැත්විණි. ඒ එම සැමරුම් තහනම් කරමින් නිකුත් වූ අධිකරණ නියෝගද නොතකාය.

❑ නැවත පදිංචි කිරීමේ අමාත්‍යවරයා ලෙස ස්වාමිනාදන් මහතා පත් කෙරුණ අතර විදේශිකයන්ට උතුරේ කිසිදු සොයා බැලීමකින් හෝ බාධාවකින් තොරව උතුරේ සංචාරය කිරීමට ඉඩ කඩ ලැබිණි. උතුරු නැගෙනහිර ප්‍රදේශවල තත්ත්වය පිළිබඳ මාධ්‍ය හරහා තොරතුරු ලබාදීමද වාරණයට ලක්කොට තිබේ.

❑ උතුරු පළාතෙන් හමුදාව ඉවත්කර එම ප්‍රදේශ නිර්මිලිටරිකරණය කරන බවට විදේශ අමාත්‍යවරයා විසින් ඉන්දියාවේදී ප්‍රකාශයක් නිකුත් කළේය.

❑ ජාත්‍යන්තර යුද අපරාධ විමර්ශන වාර්තාව කල්දමා එම වාර්තාව ප්‍රකාශයට පත්කිරීමට පෙර දේශීය විමර්ශන ක්‍රියාවලියක් ආරම්භ කිරීම සඳහා විදේශ අමාත්‍යවරයා එකඟවිය. එක්සත් ජාතීන්ගේ විශේෂ බලයලත් නිලධාරීන්ට ඕනෑම අවස්ථාවක ශ්‍රී ලංකාවට පැමිණ විමර්ශන කටයුතු කිරීමට සහ වාර්තා නිකුත් කිරීමට අවසර දෙන බවට විදේශ අමාත්‍යවරයා විසින් මානව හිමිකම් කොමසාරිස්ට‍ද ලිඛිත පොරොන්දුවක් ලබාදී තිබේ.

❑ දකුණු අප්‍රිකානු නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණ සාකච්ඡා ක්‍රියාවලියක් ආරම්භ කිරීමට එකඟවීම මගින් විදේශ මැදිහත්වීමකට ඉඩ සැලසිණි.

❑ ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගායනා කිරීමට එකඟ වීම තුළින් නව ගැටුම් ඇති කිරීම සහ වෙන්ව සැලකීම සාධාරණීකරණය කිරීම.

❑ 19 වන සංශෝධනය මගින් ස්වාධීන පොලිස් කොමිසමක් ඇති කෙරිණි. ඒ මගින් විධායකය සහ පාර්ලිමේන්තුව අතර බලතල බෙදීයාමේ ව්‍යාකූල තත්වයක් නිර්මාණය කරන ලදී.

❑ යුද්ධයේදී සුවිශේෂ සේවාවක් ඉටු කළ ඉහළ හමුදා නිලධාරීන්ට එරෙහිව අහූත චෝදනා එල්ල කිරීම සහ ප්‍රශ්න කිරීම මරණ දඬුවම් ආදිය පැනවීම තුළින් උතුරේ ස්ථානගතකර ඇති හමුදාවන්ගේ මානසිකත්වය දුර්වල කෙරිණි. ඊට සමගාමීව දරුණු අපරාධවලට සම්බන්ධ කොටි තුස්තවාදීන්ට නිදහස ලබාදීමේ ක්‍රියාමාර්ග අනුගමනය කළේය. නඩු පැවරීම් සඳහා රදවා තබාගෙන සිටි ප්‍රබල කොටි සාමාජිකයන් 200කට අධික පිරිසක් නඩු විභාගයින් තොරව නිදහස ලබාදීම මීට එක් උදාහරණයකි.

❑ හදිසි නීතිය නොමැති තත්වයක් යටතේ යුද හමුදාව විසින් සාමාන්‍ය පොලිස් රාජකාරි ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් නිකුත් කළ යුතු මාසික ගැසට් නිවේදනය නිකුත් නොකිරීම මගින් යුද හමුදාව කඳවුරු තුළට කොටු කිරීම.

❑ දෙමළ ඩයස්පෝරා සැණකෙළික් පැවැත්වීමට කටයුතු යෙදීම හරහා ඔවුන්ට නීත්‍යානුකූලව ලංකාව තුළ ක්‍රියාත්මකවීමට ඉඩ සැලසනු ලැබිණි.

රත්තනදෙණියේ මේධානන්ද හිමි

රාජ්‍ය දුරාචාරයේ පියවරු සහ පුත්තු

අමතක වූ අතීතයෙන් බිඳක්

මෙරට දේශපාලන සංස්කෘතියේ මුල්බැස ඇති ජරාජීර්ණ අංග කෙරේ වූ මහජන විරෝධය මහින්ද රාජපක්ෂගේ පරාජය බලවත් කරවන සාධකයක් ලෙස ක්‍රියා කළේය. විශේෂයෙන් රටේ මෑත ඉතිහාසයවත් නොදන්නා ෆේස්බුක් තරුණ පරපුර අතර මේ විරෝධය පහසුවෙන් අවුලා තැබිය හැකි විය. මෙරට රාජ්‍ය දුරාචාරයේ ප්‍රභවය හා එහි අතීතය පිළිබඳ මේ සටහන ලිවීමට අප අදහස් කළේ "කොයි ආණ්ඩුවත් ඕවා කළා" යන සරල තර්කය මතු කිරීමට වඩා ප්‍රශ්නයේ සැබෑ ස්වරූපය වටහාගැනීම සඳහාය.

1977න් පසු මෙරට සිදුවූ ආර්ථික සමාජ විපර්යාසය රටේ දේශපාලන සංස්කෘතිය දූෂණය වීම කෙරෙහි ද තීරණාත්මක ලෙස බලපෑවේය. 1977න් පසු බලයට පත් සෑම ආණ්ඩුවක්ම ඒ දූෂිත ක්‍රමය පෝෂණය කරමින් පවත්වාගන්නා පිළිවෙතක් අනුගමනය කළේය. රාජපක්ෂ පාලන කාලයේදී ත්‍රස්තවාදය පැරදවීම ඇතුළු විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් මෙරටට ලැබුණද මේ ජරාජීර්ණ දේශපාලන සංස්කෘතිය පැරදවීමට රාජපක්ෂ ආණ්ඩුව සමත් වූයේද නැත. අනෙක් අතින් දූෂිත දේශපාලනයට අදාළ සිදුවීම් ඔස්සේ දියත් වූ අති විශාල බොරු ප්‍රචාරක යාන්ත්‍රණයක් ද ආරම්භයේ සිටම රාජපක්ෂ ආණ්ඩුවට එරෙහිව ක්‍රියාත්මක වූ අතර අවසානයේදී සිංහල ඡන්ද මහින්ද රාජපක්ෂගෙන් දුරස් කිරීමට මේ කාරණා බලවත් සාධක ලෙස ක්‍රියා කළේය.

එසේ වුවද වත්මන් යහපාලන නාටකයේ බොහෝ පිතාවරුන් මෙරට රාජ්‍ය දුරාචාරයේ පියවරු සහ බලවත් අනුග්‍රහකයෝද වීම බියකරු විහිළුවකි. යහපාලනයේ නාමයෙන් අද සිදුවෙමින් පවතින රට වටලෑමේ මෙහෙයුම කුමක්දැයි වටහාගැනීම සඳහා අමතක වූ අතීතය දෙස මඳක් හැරී බැලීම ඉතා වැදගත්ය.

❑ ධර්මිෂ්ඨ සමාජයක් යන සටන් පාඨය යටතේ තරග කළ එක්සත් ජාතික පක්ෂය 1977 ජූලි 22 වැනිදා පැවති මැතිවරණයෙන් පාර්ලිමේන්තු ආසන 168න් 140ක් හෙවත් හයෙන් පහක බලයක් ලබාගනිමින් විශිෂ්ඨ ජයග්‍රහණයක් අත්කර ගත්තේය. දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ ආස 18ක් ලබා ගත් අතර කේවල ක්‍රමයට පැවති ඡන්දයෙන් ශ්‍රීලනිපයට ලබා ගත හැකි වූයේ ආසන 8ක් පමණි. මෙම මැතිවරණයෙන් එජාපය ලබා ගත් ජයග්‍රහණය රටේ සමාජ ආර්ථික දේශපාලන වෙනස්කම් රැසකට හේතුවිය.

❑ 1977 මැතිවරණ ජයග්‍රහණයත් සමඟ සතියක කාලයක් පොලිසි සඳහා නිවාඩු ලැබිණි. ප්‍රතිපල ප්‍රකාශයට පත්වූ දිනයේ සිට ප්‍රචණ්ඩ ක්‍රියා බහුලව වාර්තා විය.

දේශපාලන ඝාතන	6
නිවාස ගිනි තැබීම්	37
පහරදීම් හා මංකොල්ලකෑම් සංඛ්‍යාව	1400
දේශපාලන පලිගැනීම් ලෙස සේවයෙන් පහකිරීම්	18462
මාරුකිරීම්	72881

❑ ඉන් මසකට පසුව අගෝස්තු 17 වැනිදා ඇතිවූ ජාතිවාදී කෝලාහලවලින්ද විශාල පිරිසක් පීඩාවට පත්වූහ. මේ පිළිබඳ කර්මාන්ත ඇමති සිරිල් මැතිව්ට පාර්ලිමේන්තුවේදී දෙමළ නියෝජිතයන්ගෙන් චෝදනා එල්ලවිය.

දේපල මංකොල්ලකෑම්	20776
නිවාස ගිනි තැබීම්	8088
ස්ත්‍රී දූෂණ	284
පහරදීම්	40000
පුද්ගල ඝාතන	100

❑ ව්‍යවස්ථා සංශෝධනයේදී අනුගමනය කළ යුතු පිළිගත් ප්‍රතිපත්තීන්ගෙන් බැහැරව බලය හිතුවක්කාරී ලෙස භාවිත කරමින් කඩිමුඩියේ ගෙන ආ සංශෝධනයක් මගින් අසීමිත බලතල සහිත විධායක ජනාධිපති ධූරය ස්ථාපිත කළ අතර 1978 පෙබරවාරි හතර වැනිදා ජේ.ආර් ජයවර්ධන මහතා මෙරට ප්‍රථම විධායක ජනපති ලෙස දිවුරුම් දුන්නේය. අනතුරුව ඒ වසරේදීම 1978 නව ව්‍යවස්ථාව සම්මත කර ගැනීම සිදුකෙරිණි.

❑ 1978 නොවැම්බර් විසිවෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කරගත් පළමු ව්‍යවස්ථා සංශෝධනය යටතේ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ප්‍රජාඅයිතිය වසර හතකට අහෝසි කිරීම සිදුකෙරිණි. තම ප්‍රධාන දේශපාලන ප්‍රතිවාදියා අක්‍රිය කිරීම මෙහි අරමුණ විය. පළමු සංශෝධනයෙන් පසු ඉදිරිපත් වූ බොහෝ ව්‍යවස්ථා සංශෝධන ඒජාපයේ හා ජනාධිපතිවරයාගේ අසීමිත බලය ආරක්ෂා කර ගැනීමේ වුවමනාව වටා කේන්ද්‍ර ගතව තිබිණි.

❑ 1978 වසරේදී නව විශ්ව විද්‍යාල පනත සම්මත කරගත් අතර එහි ප්‍රධාන අරමුණ වූයේ ආණ්ඩුවට එරෙහි ශිෂ්‍ය බලවේග හීලෑ කරමින් විශ්ව විද්‍යාල දේපලවල බලයට අවනත කර ගැනීමය. මේ යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ඇතුළු බලධාරීන් ජනපතිට අවශ්‍ය ලෙස පත්කර ගැනුනු අතර දඩි ක්‍රියාමාර්ග ගැනීමේ බලතල ඔවුන්ට පවරාදෙන ලදී. මීට අමතරව අධ්‍යාපනය විකිණීම සඳහා මූලික පසුබිම සකස්කළ ප්‍රවේශයක් ලෙසද නව විශ්ව විද්‍යාල පනත සැලකිය හැකිය.

❑ මේ කාලය වනවිට ආණ්ඩුවේ මර්දනකාරී පිළිවෙත්වලට එරෙහිව විශ්ව විද්‍යාල ප්‍රජාව සක්‍රියව නැගී සිටි අතර සිසුන් මර්දනය පන්ති තහනම් කිරීම්, ශිෂ්‍යභාවය අහෝසි කිරීම මෙන්ම සන්නද්ධ පාතාල මැර පිරිස් යොදා ගැනීමද ඉතා සුලබ දෙයක් බවට පත්වෙමින් තිබිණි. 1978 මාර්තු 16 වැනිදා කැළණි සරසවියේ ඇතිවූ එවැනි සිදුවීමකින් ක්‍රිස්ටෝපර් ජයතිලක නැමති මැරයා මරණයට පත්වූ අතර ජනාධිපතිවරයා ඔහුගේ අවමඟුලටද සහභාගී විය. එකල රැකී රක්ෂා හා යෞවන කටයුතු ඇමතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහද මෙම විශ්ව විද්‍යාල පාලනය කිරීමේ කටයුතු සඳහා සක්‍රියව මැදිහත් වී තිබේ.

❑ මේ කාලවකවානුවේදී ආණ්ඩුවේ ප්‍රධාන මැර නායකයා වූයේ ගෝනවල සුනිල්ය. ස්ත්‍රී දූෂණයක් නිසා දස අවුරුදු සිර දඩුවමක් විඳීමින් සිටි මේ සාහසිකයාට ජනාධිපති ජයවර්ධන විසින් විශේෂ සමාවක් ලබාදී මුළු දිවයිනටම බල පවත්වන සාම විනිසුරු පදවියක් පිරිනමා තිබිණි. ගෝනවල සුනිල් රනිල් වික්‍රමසිංහගේ ප්‍රධාන ආධාරකරුවෙක් වූ අතර ඔහු නිදහස් කර ගැනීම සඳහා ජනාධිපතිවරයා පොළඹවාගෙන තිබුණේද රනිල් විසිනි.

❑ රුපියල් 300ක පඩි වැඩිවීමක් ඉල්ලා 1980 ජූනි 5 වෙනිදා කැම පැයේදී සිදුකල පිකටින් ව්‍යාපාරයට මැරකණ්ඩායම් අවස්ථා ගණනාවකදී පහර දුන්නේය. රජයේ සැපයුම් දෙපාර්තමේන්තු සේවකයකු වූ ඩී සෝමපාල මහතා එහිදී මරණයට පත්විය.

❑ අසූවේ ජූලි වර්ජනය සැලකිය හැක්කේ එජාපයේ මර්දනය ඉනාම සාහසික ලෙස ප්‍රකාශයට පත්වූ අවස්ථාවක් වශයෙනි. 1980 ජූලි මස රුපියල් 300ක පඩි වැඩි වීමක් ඉල්ලා පැවති වර්ජනයෙන් 80,000ත් 100,000ත් අතර පිරිසකට රැකියා අහිමි කරන ලද්දේ සේවය අතහැර ගියා සේ සලකමිනි. විශාල පිරිසක් මෙහිදී මැර ප්‍රහාර, පොලිස් ප්‍රහාර හා සිරගතකිරීම් වලට ලක්වූ අතර සිත් තැවුලට පත් වර්ජකයන් 39 දෙනෙක් සිය දිවි හානි කොට ගෙන තිබිණි.

❑ එවකට රැකීරක්ෂා හා අධ්‍යාපන ඇමති වූ රනිල් වික්‍රමසිංහ විසින් 1981 ජනවාරි 21 වැනිදා අධ්‍යාපන ධවල පත්‍රිකාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. සරසවි සිසුන්, ආචාර්යවරුන්, ගුරු සංගම්, සම්භාවනීය නායක හිමිවරුන්, බෞද්ධ සංවිධාන ආදී බලවේග රැසක් ඊට එරෙහි වූයේ නිදහස් අධ්‍යාපන අයිතියට, බෞද්ධ අධ්‍යාපනයට හා සිංහල බසට එමඟින් සිදුවන හානිය පෙන්වා දෙමිනි. පනත විවාදයට ගත් දිනයේ රට පුරා සිසු උද්ඝෝෂණ ඇතිවිය. පාර්ලිමේන්තුව වටලා උද්ඝෝෂණයේ නිරත වූ සිසුන්ට මිලේච්ඡ පොලිස් ප්‍රහාරයක් එල්ල වූ අතර අශ්වයන් ලවා පැහිම නිසා සිසුන් කීප දෙනෙක් සදාකාලික අබ්බගතයන් බවට පත්විය.

❑ 1981 දිස්ත්‍රික් සංවර්ධන සභා ඡන්ද උනුසුම අතරතුර උතුරේ සන්නද්ධ කණ්ඩායම් විසින් පොලිස් නිලධාරීන් දෙදෙනකු හා එජාප මැතිවරණ අපේක්ෂකයෙකු ඝාතනයට ලක්කර තිබිණි. ඒ මත ඇතිවූ කලකෝලාහලවලදී ආණ්ඩුවෙන් උතුරට යවා සිටි මැර පිරිස් නිවාස සහ කඩ සාප්පු ගිනිබත් කළ අතර ඔවුන් විසින් යාපනය පුස්තකාලයද ගිනි තබා විනාශ කරන ලදී. එය දකුණු ආසියාවේ විශාලතම පුස්තකාලය වූ අතර වටිනා පොත් සහ අත්පිටපත් 90000ක් පමණ එහිදී විනාශයට පත්විය.

මේ කලබලකාරී තත්ත්වය මත මැතිවරණය පැවැත්වීම සඳහා මැතිවරණ කොමසාරිස් සතු බලය ආණ්ඩුව අතට ගත්තේය. ඡන්ද ස්ථානාධිපතිවරු 94 දෙනෙකුගේ පත්වීම් අවලංගු කෙරිණි. මැතිවරණ කටයුතු සඳහා කොළඹ සිට දුම්රියක් පුරවා මැර පිරිස් හා සෙනඟ යාපනයට ගෙන ගිය අතර නියෝජිත අකැප්පනය කොට මැතිවරණය මෙහෙයවීමේ කටයුතු ඔවුන් අතට පත් කෙරිණි. ඡන්ද පෙට්ටි අතුරුදන්වීම්, හොර ඡන්ද දමීම්, බිය ගැන්වීම් ආදී මැතිවරණ වංචා විශාල ලෙස සිදුවූ අතර එය සැලකිය හැක්කේ ඒසා බරපතල ක්‍රියා රැසක් වාර්තා වූ ලංකාවේ පළමු මැතිවරණය වශයෙනි.

6 වැනි පිටුවට

5 වැනි පිටුවෙන්...

රාජ්‍ය දුරාචාරයේ පියවරු සහ පුත්තු

මැතිවරණ නිලධාරියකු ප්‍රකාශ කර තිබුණේ නිලධාරීන් ලෙස තමන්ට මැර පිරිස්වල බලපෑම්වලට ලක්වන්නට සිදුවූ පළමු මැතිවරණයද එය බවය.

- වසර හතරකට තමන් කැමති ඕනෑම අවස්ථාවක ජනාධිපතිවරණයක් කැඳවීමේ බලය ජනපති අතට ලබාගැනීම සඳහා තුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේදී සම්මත කර ගැනිණි. ඒ අනුව නියමිත කාලයට වසර දෙකකට පෙර 1982 ඔක්තෝබර් 21 වැනිදා ලංකාවේ පළමු ජනාධිපතිවරණය පැවැත්වූ අතර ජේ.ආර්. ජයවර්ධන ඡන්ද 3450811ක් හෙවත් 52.91ක ප්‍රතිශතයක් සහිතව ජයගත්තේය. මැතිවරණය පවත්වන ලද්දේ විරුද්ධ පක්ෂ නායිකාව වූ සිරිමාවෝ බණ්ඩාරනායකට මැතිවරණයට තරග කිරීමට තබා කිසිදු දේශපාලන කටයුත්තකට සහභාගී විය නොහැකි ආකරයට ඇගේ ප්‍රජා අයිතිය අහිමි කර තිබූ තත්ත්වයක් යටතේය. රාජ්‍ය බලයේ ආනුභාවයද සහිතව නීති විරෝධී ක්‍රියා රැසක් සිදුව තිබූ අතර කොබ්බෑකඩුවගේ ජන්දය පවා වෙනත් අයෙක් විසින් වංචනික ලෙස භාවිතා කර තිබිණි.

- ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ පිරිහීම මැයෙන් 1982 ජූලි 22වැනිදා සමස්ථ ලංකා බෞද්ධ සම්මේලන ග්‍රන්ථාගාරයේ පැවති ප්‍රසිද්ධ දේශණයකදී මහාචාර්ය එදිවීර සරත්චන්ද්‍ර ඇතුළු උගතුන් පිරිසකට මැර ප්‍රහාරයක් එල්ල කෙරිණි. කර්මාන්ත ඇමති සිරිල් මැතිව්ගේ ලේකම්වරයෙකු වන පියසේන ජයවීර නැමැත්තා ප්‍රහාරයේ වගකීම බාර ගත්තේය.

- ලංකා සම සමාජ පක්ෂයේ හිටපු මන්ත්‍රීවරියක වූ විවියන් ගුණවර්ධන මහත්මියට කොල්ලුපිටිය පොලිසියේදී බිම දමා පහර දුන් අතර ඊට උසාවියෙන් වරදකරු වූ උප පොලිස් පරීක්ෂකවරයාට ජනාධිපති උපදෙස් මත පසුවදාම උසස්වීමක් ලැබිණි. එම කින්දෑව දුන් විනිසුරුවරුන්ගේ නිවෙස් ඉදිරිපිට රජයේ වාහනවලින් පැමිණි මැර පිරිස් කලකෝලාහල කළෝය.

- හතරවැනි ව්‍යවස්ථා සංශෝධනය ජනාධිපතිවරයාට අවශ්‍ය වූයේ තමන්ට හයෙන් පහක බලයක් තිබූ පාර්ලිමේනතුවේ නිල කාලය මැතිවරණයකින් තොරව දීර්ඝ කර ගැනීම සඳහාය. ඒ අනුව 1982 දෙසැම්බර් 23 වැනිදා සිට මෙම සංශෝධනය නීතිගත කරනු ලැබිය.

- ප්‍රතිවාදීන් මර්දනය කිරීම සඳහා නක්සලයිට් කුමන්ත්‍රණ කතාවක් නිර්මාණය කළ එජාපය ඒ යටතේ විජය කුමාරතුංග, හෙක්ටර් කොබ්බෑකඩුව, රත්නසිරි වික්‍රමනායක ඇතුළු පිරිසක් අත්අඩංගුවට ගත්තේය. මහ මැතිවරණයක් නොපවත්වා පාර්ලිමේන්තු කාලය දීර්ඝ කර ගැනීමේ ජනමත විචාරණයට හේතුව ලෙස එජාපය ඉදිරිපත් කළේද නක්සලයිට් කුමන්ත්‍රණ කතාවය. කුමන්ත්‍රණ කරුවන් පාර්ලිමේන්තුවට පැමිණීම වලකාලීම සඳහා ජනමත විචාරණයක් පවත්වන බව නිවේදනය කෙරිණි.

මේ දූෂිත දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම සඳහා වූ ප්‍රබල අරගලයක් මේ රටට අවශ්‍ය බව සැබෑය. එහෙත් අද සිදුවෙමින් පවතින්නේ එවැන්නක් නොවේ. අද සිදුව ඇත්තේ අතීතයේ සිටම මේ රටේ සැබෑ ජයග්‍රහණවලට එරෙහිව කටයුතු කළ දූෂිත බලවේග තමන්ගේ සැබෑ රකුස් මුහුණ සඟවාගැනීම සඳහා ව්‍යාජ යහපාලන වෙස්මුහුණක් පෙරට ගැනීමය.

- මේ අනුව මහ මැතිවරණයක් අවශ්‍යව නැද්ද යන කාරණය මුල් කරගෙන 1982 දෙසැම්බර් 22 වැනිදා ජනමත විචාරණයක් පවත්වනු ලැබිය. එහිදී පාර්ලිමේන්තු කාලය දීර්ඝ කර ගැනීමට පක්ෂව ඡන්ද 54.66ක් ද ඊට එරෙහිව ඡන්ද 45.34ක් ද ලැබී තිබිණි. එහෙත් එය මුළුමනින්ම ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝණය කළ අවස්ථාවක් වූ අතර ජනමත විචාරණය පවත්වන ලද්දේ රාජ්‍ය බලය යොදවා විරුද්ධ පක්ෂ ව්‍යාපාරය මුළුමනින්ම පාගේ අඩපන කළ තත්ත්වයක් යටතේය. ඔක්තෝබර් 28 වැනිදා වනවිට ජනාධිපතිවරයා සියලු ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් දින රහිත ඉල්ලා අස්වීමේ ලිපි ලබාගෙන තිබිණි. විජය කුමාරතුංග, ශ්‍රීලනිප මහ ලේකම් රත්නසිරි වික්‍රමනායක, ඇතුළු එම පක්ෂයේ දිස්ත්‍රික් සංවිධායකවරුන් විසිදෙනෙක් හදිසි නීතිය යටතේ අත්අඩංගුවට ගෙන තිබිණි. රට පුරා හදිසි නීතිය පනවා තිබිණි. විරුද්ධ පක්ෂයේ ප්‍රධාන පුවත්පත වූ "**ඇත්න**" පුවත්පතට, යාපනයේ පළවූ "**සුදන්ධරන්**" පුවත්පතට හා ශ්‍රීලනිප පක්ෂ මූලස්ථානයට සීල් තබා තිබිණි. ඊට අමතරව මැර බලය, ඡන්ද මංකොල්ලකෑම් හා බිය ගැන්වීම් විශාල වශයෙන් වාර්තා වූ අතර විශාල ඡන්ද මංකොල්ලයක් සිදු කෙරිණි. ජනමත විචාරණයෙන් සිව් වසරකට පසු ඡන්ද කොමසාරිස්වරයා නිකුත් කළ වාර්තාවකින්ද ඒ බව පිළිගෙන තිබේ.

- උතුරේ හමුදා සෙබළුන් දහතුන් දෙනෙක් මරා දැමීමේ සිදුවීමක් මුල් කරගෙන 1983 ජූලි 24 වැනිදා දෙමළ ජනයාට එරෙහි කොළඹින් ආරම්භ වූ සාහසික ක්‍රියා මාලාවක් වේගයෙන් රට පුරා පැතිරී ගියේය. කඩ සාප්පු හා නිවාස ගිනි තැබීම්, කොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ, පහරදීම්, මිනිමැරුම් ආදිය සතියක් පුරා සිදුකෙරිණි. රජයේ තක්සේරුව අනුව මරණ 471 සිදුවූ බව කියවුණද ඇතැම් වාර්තා පෙන්වා දෙන්නේ එ සංඛ්‍යාව 2000ක් පමණ විය හැකි බවය. මේ ජාතිවාදී කෝලාහලය එජාපයේ සහ එහි ඇමතිවරුන්ගේ මැදිහත් වීම මත සිදුවූවක් බව රාජන් හූල් සිය "බලයේ මහන්තත්වය" කෘතියෙන් පෙන්වා දෙයි. මේ ක්‍රියාව ඒ වනවිට නැගී එමින් තිබූ දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය ශක්තිමත් කිරීම සඳහා විශාල උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කළේය.

- කළු ජූලියෙන් අනතුරුව එහි වගකීම වමේ පක්ෂ කිපයක් මත පැටවීමට ජයවර්ධන ආණ්ඩුව කටයුතු කළේය. ඒ අනුව 1983 ජූලි 30 වැනිදා ජනතා විමුක්ති පෙරමුණ, කොමියුනිට්ස් පක්ෂය හා නව සමසමාජ පක්ෂය තහනම් කෙරිණි. ඒ යටතේම අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයද තහනම් සංවිධානයක් බවට පත්විය.

- 1983 දෙසැම්බර් 27 වැනිදා පේරාදෙණිය සරසවිය තුළ පොලිසියක් ඉදි කිරීමට ආණ්ඩුව කටයුතු කළේය. ඒ වනවිට පේරාදෙණියේ සිසුන් 63 දෙනකුගේ ශිෂ්‍ය භාවය අහෝසි කොට තිබිණි. පොලිසිය පිහිටුවීමට එරෙහිව පැවැති උද්ඝෝෂණ සහ ඇති වූ නොසන්සුන්තාවලදී පද්මසිරි අබේසේකර සහ රෝහණ රත්නායක යන සිසුන් පොලිස් වෙඩි පහරින් මරණයට පත්විය.

- ආණ්ඩුව මේ අන්දමින් ව්‍යවස්ථාපිත ඒකාධිපතිත්වයක් ඔස්සේ ආරම්භ කළ ජනතා විරෝධී ගමන උතුරේත් දකුණේත් අති විශාල ලේ වැගිරීම් රැසකට හේතු විය. උතුරේ දෙමළ සන්නද්ධ අරගලය පෝෂණය කිරීමට මෙන්ම දකුණේ ඇති වූ තරුණ කැරැල්ල කෙරෙහි ද එජාප ආණ්ඩුවේ ක්‍රියාකලාපය බලපෑවේය. අවසානයේදී එය තාවකාලික නිමාවකට පත් වූයේ 80 දශකය අවසානයේදී ලක්ෂයකට ආසන්න පිරිසකට අකාලයේ ජීවිත අහිමි කරමිනි.

මෙහි දක්වා ඇත්තේ 1977න් පසුව දූරාචාරය, බලයේ අයථා යෙදවීම්, මර්දනය, ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කිරීම්, ආදිය රාජ්‍ය බලයේ නිත්‍ය අංගෝපාංග ලෙස වැඩි ආ ආකාරය පිළිබිඹු වන මූලික සිදුවීම් කිපයකි. රට සරිලන ලෙස විවෘත ආර්ථිකය ඔස්සේ කය පිනවන පාරිභෝජනවාදයද ඔසවා තැබෙන අතර දේශපාලනය පාපතර රැකියාවක් බවට පත්වන සමාජ පසුබිමද එයම වෙයි. 1977ට පෙර යුගයේ දේශපාලනය තුළද මැර ක්‍රියා, අයථා කටයුතු අසන්නට ලැබුණද, එහි මහා පරිමාණ වර්ධනයක් හා රාජ්‍ය සුරක්ෂිතභාවයක් සමඟ එය දේශපාලනයේ නිත්‍ය අංගයක් බවට පත්වන්නේ 77න් පසු ආරම්භ වූ ජරාජීර්ණ දේශපාලන සංස්කෘතිය යටතේය. මැති ඇමතිවරුන්ගේ වරප්‍රසාද නොසිතූ ලෙස ඉහල යාම පමණක් නොව නොනිල වශයෙන් අසීමිතව මුදල් ඉපයිය හැකි මාර්ග රාශියක්ද මේ සමඟම ඔවුන් හමුවේ විවර කෙරිණි. දේශපාලඥයන්ට පමණක් නොව ඔවුන්ගේ හිත මිතුරන්ටද මේ හරහා ගජ පෝසතුන් වීමේ අවස්ථා උදාවූ අතර රාජ්‍ය අනුග්‍රහය ලබන පාදඩ රස්තියාදුකාර සමාජ කණ්ඩායම් නඩත්තු කිරීමද සුලබ දෙයක් බවට පත්විය. මේ රස්තියාදුකාර පිරිස් දේශපාලන වුවමනා අනුව සාහසික ක්‍රියා සඳහා යෙදවුණු අතර ඊට ප්‍රතිලාභ ලෙස ඔවුන්ට විශාල සැලකිලි හා ඔවුන්ගේ විවිධ ජාවාරම් සඳහා අවශ්‍ය රැකවරණය දේශපාලඥයන් වෙතින් ලැබිණි. මේ අනුව මැර බලය, ප්‍රචණ්ඩත්වය, අයථා ඉපයීම්, කළු සල්ලි, නීති විරෝධී ජාවාරම්, ආදිය දේශපාලන බලයේ නිත්‍ය අංගෝපාංග බවට පත්කෙරුණු අතර මේ දූෂිත ක්‍රමයේ පළමු අනුග්‍රාහකයා ලෙස සැලකිය හැක්කේ හිටපු ජනපති ජේ. ආර්. ජයවර්ධන මහතාය. ඔහු 1977න් පසු ඇති කරන ලද වෛෂයිකම් මේ දූෂිත දේශපාලන සංස්කෘතියේ අත්තිවාරම් බවට පත්වූ අතර එවකට රනිල් වික්‍රමසිංහ මහතාද ජයවර්ධන ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරයෙකු ලෙස කටයුතු කළේය. මේ අන්දමට ජයවර්ධන, රනිල්, ප්‍රේමදාස ආදී සුසංයෝගයක් ඔස්සේ ආරම්භ වූ මේ දූෂිත දේශපාලන සංස්කෘතිය ඉන් අනතුරුව බලයට පත් සෑම ආණ්ඩුවක් යටතේම නිරුපද්‍රිතව පෙරට ගියේය.

රනිල් වික්‍රමසිංහ යනු මේවායින් තොර පිරිසිදු නායකයෙක් බවට බොල් මතවාදයක් රටේ පතුවාහැර තිබුණද එය තවත් මෙගා බොරුවක් බව රනිල්ගේ සහ රටේ සැබෑ යටගියාව පෙන්වා දෙයි. මේ දූෂිත දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම සඳහා වූ ප්‍රබල අරගලයක් මේ රටට අවශ්‍ය බව සැබෑය. එහෙත් අද සිදුවෙමින් පවතින්නේ එවැන්නක් නොවේ. අද සිදුව ඇත්තේ අතීතයේ සිටම මේ රටේ සැබෑ ජයග්‍රහණවලට එරෙහිව කටයුතු කළ දූෂිත බලවේග තමන්ගේ සැබෑ රකුස් මුහුණ සඟවාගැනීම සඳහා ව්‍යාජ යහපාලන වෙස්මුහුණක් පෙරට ගැනීමය. එබැවින් දැනමෙන් පසුබැ ගැලවී ඇති මේ යහපාලන වෙස් මුහුණ පිටුපස ඇති සැබෑ මුහුණ කුමක්දැයි හඳුනාගැනීම මේ මොහොතේ අප හමුවේ වන වැදගත්ම අභියෝගය වෙයි.

ඉසුරු ප්‍රසංග

2001 වසර අවසානයේ එජාප ආණ්ඩුවක් බලයට පත්වීමෙන් අනතුරුව රනිල් වික්‍රමසිංහ මහතා 2002 පෙබරවාරි 22 වැනිදා කොටි සංවිධානය සමඟ සටන් විරාම ගිවිසුමකට අත්සන් තබන ලද්දේය. ඒ මෙරට පාර්ලිමේන්තුවට පවා එකී ගිවිසුම පිළිබඳ ඇත්ත කරුණු වසන් කරමිනි. මේ වංචාකාරී සාමය ත්‍රස්තවාදීන් අත කදිම යුධ මෙවලමක් බවට පත් විය. රටේ සෙවර්භාවයට අවමන් කරමින්, සටන් විරාමයේ අවම කොනද්දෙසි පවා අමු අමුවේ උල්ලංඝනය කරමින් කෙරෙන සාපරාධී ක්‍රියා රැසකට කොටි ත්‍රස්තයෝ දායක වූහ. රනිල් වික්‍රමසිංහගේ මෙහෙයවීම යටතේ මේ රටේ ඒකීයභාවය, ජාතික ආරක්ෂාව හා මනුෂ්‍යත්වයේ සියලු වටිනාකම් බෙදුම්වාදී ත්‍රස්ත කල්ලියක් ඉදිරියේ පරදුවට තැබුණේ එසේය.

අද යහපාලනය නැමති විශාල බොරුවකට මුවා වී පස් මසක් තුළ රට විශාල අවුලකට ඇද දමා ඇති වත්මන් අගමැතිවරයා එදා තම දෙවසරක කෙටි පාලන කාලය තුළ රට මේසා බලවත් මානුෂීය අර්බුදයකට ඇද දමන ලද්දේ සාමය නැමති අති විශාල බොරුවකට මුවා වෙමිනි. අද යහපාලනය ගැන ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරන ඊනියා සිවිල් සමාජ බුද්ධිමතුන් ආදී බොහෝ දෙනා එදා මේ සාම ව්‍යසනයට අනුබල සැපයූ සාහසිකයන් බව සිහි නඟා ගැනීම වැදගත්ය.

එදා ජාතික බලවේග මැදිහත් වී රනිල්ගේ ගමන නතර නොකරන්නට මේ විනාශය තව කෙතරම් දුර යනු ඇත්දැයි සිතා ගැනීම පාඨක ඔබට භාරය. සාම ව්‍යසනයෙන් යහපාලන ව්‍යසනය කරා යන්නට පෙර අප විසින් මේවා ගැඹුරින් අවධානයට ගත යුතුය. මේ වනාහී අමතක වූ අතීතයෙන් අංශු මාත්‍රයක් පමණි.

- සන්නද්ධ කල්ලියක් ලෙස පැවති කොටි සංවිධානයට වෙනම භූමියක්, හමුදාවක්, පොලිසි බැංකු උසාවි ආදිය සහිත පරිපාලන යාන්ත්‍රණයක් සහිත වෙනම රාජ්‍යයක තත්ත්වයට ඔසවා තැබීමට සටන් විරාමය විශාල පිටුබලයක් විය. බැංකු, පොලිසි, උසාවි, මෙන්ම නව කොටි කඳවුරු, බංකර, ගුවන් පථ, සන්නිවේදන මධ්‍යස්ථාන ආදිය සටන් විරාමය යටතේ කඩිනමින් ස්ථාපිත කෙරිණි.

- කොටි තහනම, හදිසි නීතිය සහ ත්‍රස්ත මර්දන පනත් ඉවත් කරගැනීමට සාමය ඉවහල් වූ අතර අත්අඩංගුවේ පසුවූ ත්‍රස්තවාදීන් රැසකට නිදහස ලැබිණි.

- කොටින්ගේ ශක්තිය තර වීමට සමගාමීව හමුදා ශක්තිය හකුළුවනු ලැබිය. හමුදාවට නව සෙබළුන් බඳවා ගැනීම සීමා කළ අතර 2002 මැයි මාසයේ සිට ගිවිසුමට අනුව උතුරේ හමුදා කඳවුරු ඉවත් කිරීම ආරම්භ කෙරිණි. ඒ වනවිට කොටි සටන් විරාම නිරීක්ෂණ කමිටුවට යෝජනා කළ ආකාරයට ඉවත් කිරීමට නියමිත කඳවුරු සංඛ්‍යාව 288ක් වූ අතර ඉන් 81ක් රජයේ ගොඩනැගිලිවල පිහිටුවා තිබිණි.

- 2002 මාර්තු 19 වැනිදා පළමු '**පොංගු තමිල්**' උත්සවය චව්නියාවේදී පැවැත්වූ අතර අනතුරුව එවැනි උත්සව උතුරු නැගෙනහිර දෙපළාත තුළ සුලබ විය. පාසැල් සිසුන් ඇතුළු පිරිස් මේවාට බලාත්කාරයෙන් සහභාගී කරවූ අතර කොටි සංවිධානය පාසැල්වලට කඩා වැදී දේශන පැවැත්වීම්, විඩියෝ දර්ශන ප්‍රදර්ශනය කරවීම්, ආදියද බහුලව වාර්තා විය.

- 2002 අගෝස්තු 20 වැනිදා කොටි "**දේදුන්න**" නමින් සිංහල පුවත්පතක් ආරම්භ කළේය.

- 2003 වසරේ කොටි විසින් අත්තර්වාර පාලනයක් ඉල්ලා සිටිනු ලැබිය. රටේ මුළු භූමියෙන් තුනෙන් එකක්, මූහුදෙන් තුනෙන් දෙකක් ඔවුන් විසින් යෝජනා කරන ලද අන්තර් වාර ස්වයං පාලන අධිකාරියට අයත් විය.

- දේශපාලන කටයුතුවල නාමයෙන් රජයේ පාලන ප්‍රදේශවල පවා කොටි කාර්යාල විවෘත කෙරුණු අතර ඒ හරහා රජයේ බල ප්‍රදේශවලට පවා නිදහසේ ඇතුල්ව සාහසික ක්‍රියාවල නිරත වීමට ත්‍රස්තවාදීන්ට නිදහස ලැබිණි. කොළඹ ඇතුළු රටේ විවිධ ප්‍රදේශ කරා කොටි චරපුරුෂ ජාලය, ඝාතන කල්ලි සහ

10 වැනි පිටුවට

රනිල් රට කළ හැටි

කළමනාකරණය හා යහපාලනය ගැන උදාහරණ කීපයක්

රනිල් වික්‍රමසිංහ වනාහී විශ්ව කර්ම ආර්ථික කළමණාකරන හැකියාවක් සහිත, දූෂණ, වංචා, හොර මැර ආදියෙන් තොර, ප්‍රතිපත්ති ගරුක, ඉදිරිගාමී නායකයෙක් බවට කිසියම් මතවාදයක් රට තුළ පැතිර තිබේ. එසේ වුවද රනිල්ගේ සැබෑ ක්‍රියාකාරිත්වය ඔහු ගැන ගොඩනංවා ඇති බොරු මතවාද සියල්ල අසුරු සැනකින් කුඩු පට්ටම් කර දමයි. කතාව කෙසේ වෙතත් ක්‍රියාවේදී රනිල් සැලකිය හැක්කේ ආර්ථික කළමනාකරණයේ දක්ෂයෙකු ලෙස නොව ඒ සම්බන්ධව මෙරට පහල වූ අදක්ෂම හා විනාශකාරීම නායකයෙකු වශයෙනි. රනිල් අගමැතිව සිටි 2002 - 2004 අතර කාලය සැලකිය හැක්කේ අතිශය හානිකර ලෙස රටේ ආර්ථික පැවැත්ම අනතුරේ හෙලූ කාලයක් වශයෙනි. පෞද්ගලීකරණ කොල්ලය රනිල්ගේ ප්‍රධාන ආර්ථික උපායමාර්ගය වූ අතර ඔහු යළි පුබුදුමූ ශ්‍රී ලංකා වැඩසටහන යටතේ රටේ වනාන්තර, ගහකොල, ජලය, සංස්කෘතික උරුමයන් පවා විකිණීමට සැලසුම් සකස් කරන ලද්දේ කිසිදු සදාචාරයකින් තොර වසල වෙළෙන්දෙකු පරිද්දෙනි. අනෙක් අතින් මෙරට සංස්කෘතික හර පද්ධතීන්ට සපුරා පටහැනි පාඩඩ, සල්ලාල, විනෝද ආර්ථිකයකට රට රැගෙන යාම ඔහුගේ අභිලාෂය වූ අතර දූෂණ, වංචා, මූල්‍ය අපරාධ ආදියද මේ සියල්ල අතරේ හොඳින්ම ක්‍රියාත්මකව තිබිණි. බරපතල මහජන විරෝධතා හමුවේ ඔහුට තම සැලසුම් ක්‍රියාවට නැංවිය නොහැකි වූවා මෙන්ම දෙවසරකට පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසාද මේ වැඩපිළිවෙල අතරමඟ අහකදමා ඇත. එහෙත් අද ඔහු ඒ සියල්ල අමතක කර ඇති බවක් පෙනේ. ඔහු නැවත බලයට පත්වීමට ඇති ඉඩකඩ ගැන කතා කරන්නේ ඒ නිසාය. එබැවින් රනිල් රට කළ හැටි නැවත මතක් කිරීම වැදගත් වේ. එසේ කිරීමෙන් ඔහුට ඡන්දය දීමේ වරදින් ඉගෙන ගැනීමට ඉඩ සැලසෙනු ඇත. එබැවින් රනිල් රට කළ හැටි පිළිබඳ කෙටි විමසුමක් මෙහි ඉදිරිපත් කරමු.

- යළි පුබුදුමු ශ්‍රී ලංකා වැඩසටහන යටතේ සියලු දේ කුණු කොල්ලයට විකුණා දමීම ජපාප ආණ්ඩුවේ මූලික ආර්ථික උපාය මාර්ගය විය. පාඩු ලබන ආයතන පමණක් නොව අධික ලාභ ලබන ආයතන පවා පෞද්ගලීකරණයට සැලසුම් කෙරුණු අතර පොදු ජනතාව මත අධික බර පටවමින්, සහන කප්පාදු කරමින් ව්‍යාපාරිකයන්ට හා කොම්පැනි කාරයන්ට විශාල සහන සලසන ප්‍රතිපත්තියක් ආණ්ඩුව අනුගමනය කළේය.
- මහජනයාට වැට බඳිද පැහැවෙන විට බදු සහන පනත මඟින් කෝටි 2000ක බදු හා ණය සහන ඉවත් කර වංචනික ව්‍යාපාරිකයන්ට සහන සැලසීණි. රාජ්‍ය බැංකුවලින් ගෙවීම් පැහැර හරින ලද කෝටි සිය ගණනක ණය මුදල් අහෝසි කළේය.
- ලාභදායී ආයතන වූ මහජන බැංකුව හා ලංකා බැංකුව ලෝක බැංකු නිර්දේශ මත ප්‍රතිව්‍යුහගත කිරීමට සැලසුම් කෙරිණි. එම ආයතන පාඩු ලබන තත්ත්වයට ගෙන ඒමේ වැයමක් ක්‍රියාත්මක වූ අතර මහජන බැංකුවට පොදුගලික බැංකුවලින් බදවා ගත් විධායකයන් 13 දෙනකු සඳහා වසරකට කෝටි පනහක මුදලක් වැයකොට තිබිණි.
- රාජ්‍ය සේවය කප්පාදු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග රාශියක් සැලකිල්ලට ගැනිනි. බඳවා ගැනීම් නතර කිරීම, ආයතන ඒකාබද්ධ කිරීම, ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීම්, විශ්‍රාම වැටුප අහෝසි කිරීම ආදිය ඉන් කිපයකි.
- අති විශාල ලාභ උපයන ආයතන ත්‍රිත්වයක් වූ දේශීය ආදායම්, සුරාබදු සහ රේගු දෙපාර්තමේන්තු එක කොට තනි අධිකාරියක් පිහිටුවීමට සැලසුම් සකස් කෙරිණි. ආදායම් බදු දෙපාර්තමේන්තු සේවක සංඛ්‍යාව 4500 සිට 450 දක්වා අඩු කරනු ලැබිය.
- විදේශිකයන්ට පහසුවෙන් ව්‍යාපාර ඇරඹීමට හා අතහැරීමට හැකි පරිදි වාණිජ නීති ප්‍රතිසංස්කරණයට ලක්විය. 2002 ජනවාරි සිට 2003 ජූනි දක්වා කර්මාන්ත ශාලා 49ක් වසා දමුනු අතර රැකියා අහිමි වූ ප්‍රමාණය 20000ක පමණ වැඩිය.
- 2002 ජනවාරි සිට ජූනි දක්වා ආයෝජන ගිවිසුම් 178ක් අත්සන් කළද ක්‍රියාත්මක වූයේ ඉන් හයකි. ආයෝජන මණ්ඩල දෙපාර්තමේන්තුවල ඇති අකාර්යක්ෂම බව ඊට හේතුවී යැයි එහි සභාපතිවරයා පුවත්පතකට ප්‍රකාශ කර තිබිණි.
- මෙරට මූදු සීමාවේ මසුන් මැරීමට විදේශ සමාගම් 14කට අවසර ලබා දුන් අතර ඒ හරහා දේශීය ධීවරයන් 150,000කගේ පැවැත්ම තර්ජනයට ලක් කෙරිණි.
- තෙල් සංස්ථාව විකුණා දමා තෙල් ආනයනය හා තෙල් පිළිබඳ ගවේෂණ කටයුතු පොදුගලික සමාගම් වලට පවරා දුන් අතර ඉන්දියාව ඇතුළු රටවල් සමඟ අවාසිදායක වෙළඳ ගිවිසුම්වලට එළැඹිණි.
- හාම්පුතුන්ට කම්කරුවන් උපරිම සූරාකෑමට ලක් කළ හැකි පරිදි කම්කරු නීති සංශෝධනය වූ අතර සේවය අවසන් කිරීමේ පනත, වනිදි සූත්‍රය, කම්කරු ආඥාවුල් පනත, ඊට අදාල උදාහරණ කිපයකි.
- වී ගොවිතැන අතහැර දැමීමට ගොවීන් පොළඹවනු ලැබිය. පෝර, පලිබෝධ නාශක, ගොවි උපකරණ, ආදියේ මිල ඉහල දැමීම, පිටරටින් සහල් හා තිරිඟු පිටි ගෙන්වීම, වී අලෙවි මණ්ඩලය කර්මාන්ත කිරීම ආදී ක්‍රියාමාර්ග ඔස්සේය.
- යළි පුබුදුමු ශ්‍රී ලංකා වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව ලක්ෂ 22 සිට ලක්ෂ 14 දක්වා අඩු කෙරුණු අතර පසුව තවත් ලක්ෂ පහකින් අඩු කිරීමට යෝජනා කෙරිණි.
- විදුලි බල මණ්ඩලය සමාගම් හතක් බවට පත්කොට විදුලි ගාස්තු අධික ලෙස ඉහල දැමීමට සැලසුම් කෙරිණි. කුඩා පරිමාණ කර්මාන්ත රැසක් අඩපණ වීමට අධික විදුලි ගාස්තු ප්‍රශ්නය හේතුවූ බව මාධ්‍ය වාර්තා ඔස්සේ තහවුරු විය.
- රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ පැවති රජයේ වතු 50ක් 2002 වසර අවසාන වීමට පෙර පුද්ගලික අංශයට විකුණන බව අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ප්‍රකාශ කළේය. (2002.09.25 ලංකාදීප)
- නව දුම්රිය අධිකාරියක් පිහිටුවා දුම්රිය ගාස්තු සියට හැත්තෑපහකින් ඉහල නැංවීමට යෝජනා කෙරිණි.
- සතොස ආයතනය විශාල වශයෙන් පාඩු ලබන තත්ත්වයට ඇද දමා තිබූ අතර සතොස සියට හතලිහක කොටස් ප්‍රමාණයක් පුද්ගලික අංශවලට පැවරීමට තීරණය කෙරිණි.
- රක්ෂණ සංස්ථාව කෝටි 60කට විකුණා දමුණු අතර එහි දේපලවල වටිනාකම තක්සේරු කර තිබුණේ අසාමාන්‍ය ලෙස අඩු මිල ගනන් යටතේය. එම දේපලවල සැබෑ වටිනාකම තක්සේරු වටිනාකමට වඩා සියගුණයකින් පමණ ඉහල වන අතර ඒ අනුව රක්ෂණ සංස්ථාව සතු මුළු දේපලවල නියම වටිනාකම ඒ කාලයේ මිල ගනන්වලට අනුව රුපියල් කෝටි හැටඋහසක් පමණ වේ.
- ජලය විකිණීම සඳහා ජලසේවා ප්‍රතිසංස්කරණ පනත සහ ජාතික ජල සම්පත් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණි.
- එප්පාවල පොස්පේට් නිධිය, සහ ඉල්මනයිට්, රූටයිල්, සර්කොන්, ටයිටේනියම්, තලාතු මිනිරන්, යපස්, තම් ආදී බනිජ සම්පත් රාශියක් කෙටි කාලයක් තුළ උකහා ගත හැකි ආකාරයට පවරාදීමට සැලසුම් කෙරිණි.
- ගාලු කොටුව සංචාරක මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ සැලසුමක් පැවති අතර එහි ඉඩම් විශාල වශයෙන් විදේශිකයන්ට අලෙවි විය.
- නොනිදන නගර, රාත්‍රී සමාජ ශාලා, කැරෝකේ, කැසිනෝ හල්, මෙන්ම ගණිකාවන් සඳහා වූ රතු එලි කලාපද පිහිටුවීමට යෝජනා කෙරිණි. අභ්‍යන්තර කටයුතු හා ක්‍රිස්තියානි කටයුතු හාර ඇමැති අමරතුංග අමාත්‍යවරයා නිවේදනයක් මගින් පෙන්වා දුන්නේ ගණිකා වෘත්තිය නීතිගත කිරීම සඳහා වූ යෝජනාවක් පාර්ලිමේන්තුවේ විවාදයට ගත යුතු බවය.
- නෝර්වේ ආසියානු සංවර්ධන බැංකුව හා ජගත් පාරිසරික පදනම එක්ව ක්‍රියාත්මක කළ රක්ෂිත කලාප කළමණාකරන හා වනජීවී ව්‍යාප්තිය යටතේ හෝර්ටන් තැන්න, රිටිගල, බුන්දල, උඩවලවෙ, වස්ගමුව, මිත්තේරිය, ආදී රක්ෂිත වනාන්තර පෞද්ගලික අංශයට විවෘත කිරීමට අපේක්ෂා කෙරිණි. ඊට ගැලපෙන ආකාරයට වන සංරක්ෂණ හා වනජීවී පනත් සංශෝධනය කළේය.
- නිවර්තන වැසි වනාන්තර පනත යටතේ ශ්‍රී පාද අඩවිය, සිංහ රාජ්‍ය, නමුනුකුළ, නාකල්ස්, දෙදිවවල, කන්නෙලිය ආදී වැසි වනාන්තර ඇමරිකානු පාලනයට යටත් කිරීමට සැලසුම් විය. මෙහිදී සිංහරාජය පවරා දීමට අපේක්ෂා කරන ලද්දේ ඇමරිකාවට ලංකාවෙන් අයවිය යුතුව තිබූ ඩොලර් කෝටි 400ක නය මුදලින් කෝටි 100කට හිලව් වන ආකාරයෙනි.

මේ වනාහි රනිල්ගේ අපූරු ආර්ථික කළමණාකරණයට අදාල උදාහරණ කිපයකි. මේවා රනිල්ගෙන් යහපාලනය හා ආර්ථික සංවර්ධනය අපේක්ෂා කරන අයගේ වෙසෙස් අවධානයට ලක්වනු මනාය.

ඉසුරු ප්‍රසංග









7 වැනි පිටුවෙන්

මරාගෙන මැරෙන බෝම්බ කරුවන් ව්‍යාප්ත කෙරිණි. මේ හරහා රටේ ජාතික ආරක්ෂාවට අදාළ වැදගත් තොරතුරු බොහොමයක් අනාවරණය කර ගැනීමට ත්‍රස්තවාදීන්ට හැකියාව ලැබිණි.

- සාමයට මුවාවෙමින් තම මිල්ටරි බලය උපරිම වශයෙන් වර්ධනය කර ගැනීමට කොටි සංවිධානය සූක්ෂම විය. එකොලොස් වතාවක් නවීන අවි ආයුධ ගෙන්වා තිබූ අතර සටන් විරාම සමයේදී කොටි සාමාජික සංඛ්‍යාව දසදහසකින් පමණ ඉහල ගිය බව ජනාධිපතිනියගේ මාධ්‍ය ප්‍රකාශක හරීම් පීරිස් මහතා ප්‍රවෘත්තිකෂට (2003.1.23 දිවයින) ප්‍රකාශ කර තිබිණි. කොටි සංවිධානය මේ ආකාරයට බලවත් වූයේ සටන් විරාම ගිවිසුමේ කොන්දේසි අමු අමුවේ උල්ලංඝනය කරමින් වීමද විශේෂ කාරණයකි. 2003 වසර වනවිට කොටි විසින් සටන් විරාමය කඩ කළ අවස්ථා 1955ක් වාර්තා වූ අතර 3500 වතාවක් ඔවුන් ගිවිසුම කඩ කොට තිබිණි.
- කොටින්ගේ ප්‍රධාන ආදායම් මාර්ග වූයේ කප්පම් ගැනීම, කොල්ලකෑම් හා බදු එකතු කිරීමය. කොළඹ සහ වෙනත් රජයේ පාලනය පැවති ප්‍රදේශවල පවා කප්පම් ගැනීම සිදු කෙරුණු අතර 2002 ජුනි 25 වැනිදා සුදර්ශිලි ප්‍රවෘත්තයේ පළ කළ දැන්වීමක් මඟින් ඔවුන් සිය බදු ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කර තිබිණි. 2001 අගහාගයේ සිට 2004 අගෝස්තු දක්වා කාලය තුළ රුපියල් කෝටි 113ක පමණ මුදලක් කප්පම් සහ බදු ලෙස අය කර ගැනීමටත්, වාහන 89ක් කොල්ලකෑමටත් කොටි සංවිධානය සමත්ව තිබූ බව 2004.9.4 වැනිදා දිවයින ප්‍රවෘත්ත වාර්තා කළේය.
- 2004 වසරේ මැද භාගය වනවිට කොටි පොලිසි 26ක් බැංකු 8ක් පිහිටුවා තිබිණි.
- වඩා අවධානයට ලක් කාරණයක් වූයේ කුඩා දරුවන් පැහැරගෙන යාමය. සෑම දෙමළ පවුලකින්ම එක් දරුවෙක් කොටි සංවිධානයට ලබා දිය යුතු බවට නීතියක් පනවා තිබූ අතර එය කඩ කරන්නන්ට දඩ දඬුවම් ලැබිණි. ලමුන් හාදීය නොහැකි නම් ඒ වෙනුවට දේපල හෝ මුදල් ලබාදිය යුතුවූ අතර මේ හේතුව නිසා පවුල් විශාල වශයෙන් කොටි ප්‍රදේශ අතහැර පලායන්නට වූහ. හමුදා පාලන ප්‍රදේශවලට පවා ඇතුළු වී එසේ අතහැර ගිය පිරිස්වලට දඬුවම් පැමිණවීමට කොටි කටයුතු කළ අතර මේ ගැන්වෙ ඉවසා ගත නොහැකි වූ දෙමාපියෝ සිය දිවි නසා ගතහ්. කොටි විසින් ලමුන් 5000ක් පමණ පැහැරගෙන ඇති බව යාපනයේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් 2002 වසරේ නිකුත් කළ වාර්තාවක දක්වෙයි.

අද රනිල්ගේ යහපාලනය වෙනුවෙන් මහින්දට එරෙහි වන සිවල් සමාජ උගතුන් එදා මේ අපරාධ සාධාරණීකරණය කළේ මනුෂ්‍යත්වයේ අවම වටිනාකම් පවා ඩොලර් කුට්ටි හමුවේ නිර්දය ලෙස උගසට තබමිනි. රනිල්ගේ සාමය මෙවැන්නක් නම් රනිල්ගේ යහපාලනය කෙබන්දක්දැයි වටහා ගැනීමට තවත් අමුතු උදාහරණ වුවමනා නොවේ.

- හමුදා පාලන ප්‍රදේශ තුළ 120 වතාවක් බලාත්කාරයෙන් ඊළාම් කොඩිය එසවීමට එල්ටීටීඊය කටයුතු කර තිබූ අතර හමුදා පාලන ප්‍රදේශ තුළද ජාතික කොඩිය එසවීම හා ජාතික ගීය ගායනා කිරීම තහනම් කෙරිණි. සිංහල ප්‍රදේශවල පවා දෙමළ බසින් වැඩ කිරීමට නියෝග පනවන ලදී.
- මේ සියල්ල අතරේ කොටි විසින් විරුද්ධ දේශපාලන ක්‍රියාධරයන්, හමුදා ඔත්තුකරුවන්, හමුදා නිලධාරීන් සහ සිවිල් වැසියන් ඝාතනය කරනු ලැබිය. 2004 සැප්තැම්බර් විසි වැනිදා වනවිට ඊපීඩීපී සාමාජිකයන් 157ක්, හමුදා නිලධාරීන් 59ක් ඇතුළු පුද්ගල ඝාතන 350ක් සිදු කිරීමට ත්‍රස්තවාදීන් සමත්ව තිබිණි.
- කොටින්ට විශාල තර්ජනයක් වී තිබූ දෙමළ ඔත්තුකරුවන් සහිත දිගු දුර මෙහෙයුම් බලකායේ සාමාජිකයන් 28දෙනාම සටන් විරාම සමය තුළ ඝාතනයට ලක්විය. මිලේනියම් සිටි පාඩම්ම නිසා හෙළිවූ තොරතුරු මත පදනම්ව මෙවන් බොහෝ ඝාතන සිදුකරන ලදී.

මෙහි දක්වා ඇත්තේ ස්වල්පයකි. බරපතලම කාරණය වන්නේ මේ සියල්ල සිදුවූයේ ඊනියා සාම වැඩපිළිවෙලක, පූර්ණ රාජ්‍ය රැකවරණය යටතේ වීමය. අද රනිල්ගේ යහපාලනය වෙනුවෙන් මහින්දට එරෙහි වන සිවල් සමාජ උගතුන් එදා මේ අපරාධ සාධාරණීකරණය කළේ මනුෂ්‍යත්වයේ අවම වටිනාකම් පවා ඩොලර් කුට්ටි හමුවේ නිර්දය ලෙස උගසට තබමිනි. රනිල්ගේ සාමය මෙවැන්නක් නම් රනිල්ගේ යහපාලනය කෙබන්දක්දැයි වටහා ගැනීමට තවත් අමුතු උදාහරණ වුවමනා නොවේ.

ඉසුරු ප්‍රසංග

රටේ ඒකීයභාවය, ජාතියේ පැවැත්ම ගැන **තීන්දු ගැනීමේ අවසාන අවස්ථාව මෙයයි**

ආචාර්ය දයාන් ජයතිලක

මිතුවරුනි, මේ වනවිට මෙරට "ජනවාර්ගික ප්‍රශ්නයට" එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් කර ගෙන කිසිදු ස්වෛරී නිදහස් රටක් නොකරන ආකාරයට සුළුතර ජාතිවාදයට උඩගෙඩි දීමට මේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල හෙවත් UNDP සංවිධානයේ ලංකාවේ නේවාසික නියෝජිතයා වන සුබනෙයි නන්දි (Subinay Nandy) තම සංවිධානය වෙනුවෙන් කළ ප්‍රකාශයක් Daily News ප්‍රවෘත්තයේ පළවුණා. මොකක්ද ඔහුගේ ප්‍රකාශය?

ඒ තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය, අපේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමග සම්මුතියක් අත්සන් කරන්නට සූදානමින් ඉන්නවා. ඒ යටතේ ඩොලර් මිලියන 3ක් ලබා දෙන්නට සූදානම්. ඔහුකීම, සාමය, සංහිඳියාව ගොඩනැගීම සහ සුළුතරයන්ගේ කේන්ද්‍රීය තීරණාත්මක දුක්ගැනවිලිවලට පිළිතුරු සැපයීමෙයින් අරමුණු කෙරෙනවා. දැන් බලන්න...ලෝකයේ කිසිදු ස්වාධීන සෙවෙරි රටක් එක්සත් ජාතීන්ගේ සංවිධානය තම රටවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් කර ගන්නේ නැහැ. එසේ කරන යම් රටක් තිබෙනවා නම් එය යුද්ධවලින් පැරදුණ කැඩුණු බිඳුණු රටක් වීම අනිවාර්යයි. එමෙම නොවන අපි වැනි රටක එවැනි දෙයක් සිදුවීම මහා පාපකර්මයක්. පැහැදිලිවම, නව යටත්විජිතවාදී සහ සුළුතර ජාතිවාදයට විශාල පිටුබලයක් වන ව්‍යාපාතියක් මෙහි ක්‍රියාත්මකයි.

මිතුවරුනි, යුද්ධවලින් පරාජය වුණු රටවල්වල සුළුතර කණ්ඩායම්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග කටයුතු කිරීමේ අවසානය අප දන්නවා. බාහිර බලවේග මැදිහත් වෙලා, මූලෝපායික වශයෙන් වැදගත් ස්ථානවල වෙසෙන සුළුතර කණ්ඩායම් සමග එක්වී වෙනම රාජ්‍යයන් ඇති කිරීමට කටයුතු කොට තිබෙනවා. අද ඉරාකයේ කුර්දිස්ථානය වෙනම රටක් ලෙස පිළිගෙන නැහැත් වෙනම රටක් ලෙස කටයුතු කරනවා. කොසෝවෝ ප්‍රාන්තය තවත් උදාහරණයක්. එතකොට ලංකාව මේ මොකක්ද කරන්න හදන්නේ? සුබනෙයි නන්දි මහත්තයා මේ පිළිබඳ මතු කරන කාරණා හතරක් තිබෙනවා.

පළවෙනි කාරණය ඊනියා කුප්‍රකට දේශීය යුද අපරාධ යාන්ත්‍රණයට සහයෝගය දීම සහ එයට මැදිහත්වීම.

මොකක්ද මේ කියන්නේ? යුද්ධ පිළිබඳ ඉතිහාසය ගත්තාම ඔය වගේ දේශීය යාන්ත්‍රණ කොහේවත් පිහිටුවන්නේ නැහැ. යුද්ධය පිළිබඳ ඔය වගේ පනත් සම්මත කරගන්න බල කරන රටවල් තමුන්ගේ රටවල් කරපු යුද්ධවලින් සිදුවුණු තුවාල සුවපත් කරන්නයි කියලා දේශීය යාන්ත්‍රණ පිහිටෙව්වේ නැහැ. වියට්නාමයේ, ලිබියාවේ, ඇෆ්ගනිස්ථානයේ, ඉරාකයේ ඔය වගේ දේශීය යාන්ත්‍රණ පිහිටෙව්වේ නැහැ. ඉරාකයේ ෆලූජා නගරය වගේ තැන්වල යුරෝනියම් අඩංගු තුවක්කු පතුරම් භාවිතා කිරීම පිළිබඳව දේශීය යාන්ත්‍රණ පිහිටෙව්වේ නැහැ. ඉතින් මේ අපි එක්සත් ජාතීන්ගේ සංවිධානය ලව්වා දේශීය යාන්ත්‍රණ පිහිටුවන්න යනවා. නිකම්ම නොවෙයිස් අය දේශීය යාන්ත්‍රණයට තාක්ෂණික සහයෝගයත් ලබා දෙන්න යනවා.

මේ සියල්ලට වඩා භයානක කාරණය වන්නේ "This Component Shall be Lead" යන්නයි. එනම් මේ දේශීය යාන්ත්‍රණයට තාක්ෂණික සහයෝගය දෙන්නේ කවුද? අපට විරුද්ධව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජාත්‍යන්තර පරීක්ෂණයක් මෙහෙයවන ජිනීවා නුවර මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය, හෙවත් OHCHR එක. අන්න බළලා මල්ලෙන් එළියට පනිනවා,ඔවුන් බැංකි මූන්ට මිසක් මානව හිමිකම් කවුන්සිලයට වග කියන්නේ නැහැ. එහි නිලධාරීන්ගේ සංයුක්තිය, ඔවුන් පත් කරන රටවල්, ආදීය පිළිබඳව ප්‍රශ්න අහන්නවත් ක්‍රමයක් නැහැ. මානව හිමිකම් කවුන්සිලය එමෙම නැහැ. එහි ලෝකයේ කලාප, රටවල් ආදීයෙහි නියෝජිතයන් තිබෙනවා. මේ OHCHR කාර්යාලය ඉස්සර නවී පිල්ලේ යටතේ තිබුණේ. දැන් සයිඩ් අල් හුසේන් කුමාරයාගේ යටතේ තියෙන්නේ. මෙහි කටයුතු පිළිබඳව මානව හිමිකම් කවුන්සිලයට වගකියන්නේ නැහැ. මේ ව්‍යාප යටිකුට්ටු කාර්යාලයෙන් තමයි අපේ දේශීය යාන්ත්‍රණයට සහයෝගය දෙන්නේ. මේක හොරාගේ අම්මාගෙන් ජේන අහනවා නොවෙයි හොරාගේ අම්මා ලව්වා පරීක්ෂණයක් කරවනවා වගේ **FCID** මොඩල් එකේ වැඩක්.

දෙවැනි කාරණය තමයි මේ රටේ අන්තර් ජනවාර්ගික විශ්වාසය , සංහිඳියාව, සමාජ ඒකාග්‍රතාවය සඳහා යාන්ත්‍රණයක් ඉදිකරනවා කියන එක.

එම යාන්ත්‍රණය ඉදිකරනු ලබන්නේ අලුතින් ආරම්භ කරන ලද ජාතික සමගිය හා සංහිඳියාව සඳහා වූ කාර්යාලය සමග. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග සමග. මගේ වචනවලින් කියනවා නම් ලංකාවේ "මෝඩි" සමග. ලංකාවේ "මෝඩිගේ" අලුත් කන්තෝරුවක් එක්ක එකතුවෙලා ඔවුන් මේ වැඩේ කරනවා.

තුන්වෙනි කාරණය තමයි එක්සත් ජාතීන් පළාත් ආණ්ඩුව යන යෙදුම නිල වශයෙන් භාවිතා කිරීම.ලංකාවේ පළාත් සභා ක්‍රමයක් තිබුණත් පළාත් ආණ්ඩු නැහැ. පළාත් සභාවට කැබිනට්ටුවක්, නිලධාරී මණ්ඩලයක් ඉන්නවා. නමුත් රටේ රාජ්‍ය කුමය ඒකීය ක්‍රමයක් වන නිසාම අපේ රටේ තියෙන්නේ එකම ආණ්ඩුවක් පමණයි. ඒ ආණ්ඩුව විසින් තමන්ගේ බලතල යම් ප්‍රමාණයක් යම් ප්‍රශ්න සම්බන්ධයෙන් පහළට පවරනවා. නමුත් ආණ්ඩු නැහැ. හැබැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන්නේ undp නායකත්වයෙන් සංවර්ධන වැඩ සඳහා උතුරු පළාත් ආණ්ඩුවට තාක්ෂණික සහයෝගය දෙන බවයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන්න පටන් ගත්තහම "උතුරු පළාත් ආණ්ඩුව" කියල ඒ පළාත් සභාවත් හිතාගන්නවා

> මංගල සමරවීර යටතේ ලංකාවේ ස්වෛරීභාවය වැසිකිළිය ඉදිරිපිට වීලූ පාපිස්සක් බවට පත් වෙලා. අද ඉන්දියාවේ අගමැති අපේ පාර්ලිමේන්තුවට ඇවිත් 19න් ඔබ්බට යන ෆෙඩරල් ක්‍රමයක් කතා කරනවා. ශ්‍රී ලංකාවේ නව ඇමෙරිකානු තානාපති පුවත්පත් සාකච්ඡාවක තුන්වතාවක් කියනවා. "ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම ෆෙඩරල් ව්‍යවස්ථාවක් කියලා. ඒතකොට "ලංකාවේ මෝඩි" දේශනයකදී කියනවා "මගේ කාලේ මම යෝජනා කළේ ෆෙඩරල් ව්‍යවස්ථාවක් නමුත් මට එය කරන්න බැරි වුණා" කියලා. ඒතුමිය වැඩිදුරටත් කියනවා, මේ රටේ ප්‍රශ්නවලට ප්‍රධාන හේතුව සිංහල බහුතරවාදීන්ගේ සමාජ ඒකාධිකාරය කියලා.

තමුන් ආණ්ඩුවක්ය කියලා. ආණ්ඩුවක් නියෙන තැන නිකම්ම රාජ්‍යයක් ඒ නැතත් රාජ්‍ය විඥානයක් ඇති වෙනවා.

ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ සමයේදී වර්ධාරාජා පෙරුමාල් පත්තරවල දැන්වීමක් දමිමා උතුරු නැගෙනහිර පළාත් ආණ්ඩුව කියලා. එච්ට රන්ජන් විජේරත්න සහ ප්‍රේමදාස ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා ලංකාවේ තියෙන්නේ එකම ආණ්ඩුවයි. පළාත් සභාවක් මිස පළාත් ආණ්ඩුවක් නැහැ කියලා. එදා වර්ධාරාජා පෙරුමාල් වෙනම රාජ්‍යයක් හදනවා කියලා තර්ජනය කරද්දි ප්‍රේමදාස ජනාධිපතිතුමා ඒක විසුරුවා හැරියා. ඒත් විග්නේෂ්වරන් අද කටයුතු කරන්නේ තමන් ආණ්ඩුවක් කරනවාය කියන මානසිකත්වයෙන් තමයි.

සිව්වැදෑරුම් වැඩකටහෙන් අවසාන පියවර තමයි යළි පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ සහයෝගයෙන් ක්ෂණික ප්‍රතිලාභ ලැබෙන අකාරයට උත්ප්‍රේරණ මැදිහත්වීමක් කරනවා කියන එක. කොහෙ ද මේ යළි පදිංචි කරන්න ඩොලර් මිලියන 1.2ක් දෙන්නේ? යාපනය සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලට. මේවා සියල්ලම බොහොම ලස්සනට කෙරිගෙන යනවා. මේ වැඩවලට මහින්ද රාජපක්ෂගේ පුනරාගමනය බාධකයක් වන නිසා විවිධාකාර උපායන් ඔස්සේ මහින්ද රාජපක්ෂව දේශපාලන සම්කරණයෙන් ඉවත් කරන්න ඔවුන් කුරුමානම් අල්ලනවා. ඒ නිසා තමයි අද ප්‍රහාකරන්ව පවා ප්‍රශ්නයක් නොවුණු අයට මහින්දව ලොකුම ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. මේ තමයි ලංකා ඉතිහාසයේ 1815න් පසුව සිදුවූ දවැන්නම පාවාදීම. අද පාර්ලිමේන්තුවේ පුදුමාකාර දේවල් සිදුවෙනවා. ඩයස්පෝරාව කියන්නේ යකෙක් නෙමෙයි. අපි එක්ක සාකච්ඡා කළා. එයාලා අපිත් එක්ක ලොකු උත්සවයක් පවත්වන්න යනවා" ආදී වශයෙන් මංගල සමරවීර දොඩවනවා. සුරේන් සුරන්දිරන් කියන විදිහට ගෝලීය දමිල සංසදයේ ප්‍රතිපත්තිමය කුළඳු හතරෙන් තුන්වෙනි එක තමයි ජාත්‍යන්තර නීතියට අනුව අනුව යුද අපරාධ පිළිබඳව ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක් ඉල්ලා අරගල කිරීම. මෙය සෘජුවම ලංකාවේ ස්වාධිපත්‍යයට, ලංකාවේ ස්වාධීනත්වයට, ලංකාවේ හමුදාවට විරුද්ධ ප්‍රහාරයක්. නමුත් මංගල සමරවීර කියන්නේ " මහින්ද රාජපක්ෂගේ කාලේ වගේ නොවෙයි. ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය එක්ක අපි යාළුයි. ඉන්දියාවත් එක්කත් අපි යාළුයි. ඉතින් හොඳ නැද්ද?" කියලා.

මහින්ද රාජපක්ෂ පාලනයේ මුල් වකවානුවේදී ඉතාමත් හොඳින් විදේශ ප්‍රතිපත්තිය කළමනාකරණය කළා.ඒත් දෙවැනි වාරයේදී නොයෙකුත් අඩුපාඩු සිද්ධ වුණා. ඒ නිසා ජිනීවා නුවර මානව හිමිකම් කවුන්සිලයේදී 2/3කට ආසන්න ඡන්දයක් ලබාදුන් සාමාජික රටවල් පවා අපෙන් ඇත් වුණා.

2012 අපරාභයේදී ඉඳන් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ආපස්සට රෝල්වන පැළැරක් බවට පත් වුණා. නමුත් අද පැළැර නැවත එළලා ලංකාවට අවශ්‍ය සහයෝගය ලබා ගන්න හදනවා වෙනුවට යහපාලන ආණ්ඩුවේ මංගල සමරවීර යටතේ ලංකාවේ ස්වෛරීභාවය වැසිකිළිය ඉදිරිපිට එලූ පාපිස්සක් බවට පත් කර තිබනවා. මම එහෙම කියන්නේ ඇයි? කිසිදු රටක් තවත් රටක නායකයකුට තමන්ගේ ව්‍යවස්ථාසභාවට ඇවිත් තමන්ගේ රටේ ව්‍යවස්ථාව සම්බන්ධ අදහස් ප්‍රකාශ කරන්න ඉඩ දෙන්නේ නැහැ. නමුත් ඉන්දියාවේ අගමැති අපේ පාර්ලිමේන්තුවට ඇවිත් 19න් ඔබ්බට යන ෆෙඩරල් ක්‍රමයක් කතා කරනවා. ශ්‍රී ලංකාවේ නව ඇමෙරිකානු තානාපති සාකච්ඡාවක තුන්වතාවක් කියනවා. "ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම ෆෙඩරල් ව්‍යවස්ථාවක් නමුත් මට එය කරන්න බැරි වුණා" කියලා. ඒතුමිය වැඩිදුරටත් කියනවා, මේ රටේ ප්‍රශ්නවලට ප්‍රධාන හේතුව සිංහල බහුතරවාදීන්ගේ සමාජ ඒකාධිකාරය කියලා. අද ඉන්දියාවේ අගමැති අපේ පාර්ලිමේන්තුවට ඇවිත් 19න් ඔබ්බට යන ෆෙඩරල් ක්‍රමයක් කතා කරනවා. ඒළඟට ශ්‍රී ලංකාවේ නව ඇමෙරිකානු තානාපති අතුල් කේෂප් (Atul Keshap) මහත්මයා Daily Mirror පුවත්පතට දුන් සම්මුඛ සාකච්ඡාවක තුන්වතාවක් කියනවා. "ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් තිබෙන්න ඕනෙ ෆෙඩරල් ව්‍යවස්ථාවක් හරහා කියලාදැන් මේ දේම "ලංකාවේ මෝඩි" පුනරුච්චාරණය කරනවා. අප්‍රේල් 25 වෙනිදා තිබුණු දේශනයකදී එතුමිය කියනවා "මගේ කාලේ මම යෝජනා කළේ ෆෙඩරල් ව්‍යවස්ථාවක් නමුත් මට එය කරන්න බැරි වුණා" කියලා.එතුමිය වැඩිදුරටත් කියනවා, මේ රටේ ප්‍රශ්නවලට ප්‍රධාන හේතුව සිංහල බහුතරවාදීන්ගේ සමාජ ඒකාධිකාරය කියලා. එතුමියගේ කතාව New Indian කියන පුවත්පතේ පළවුණේ "සිංහල ඒකාධිකාරිය හමාර විය යුතුයි" කියලා. දැන් මේ තුන්ගොල්ලොම එකම දේ කියනවා. දැන් මේ වර්ධනය වී තිබෙන්නේ නීව බව මිස මිත්‍රත්වය නොවෙයි. අපි එක් දෙයක් අනිවාර්යයෙන්ම පිළිගන්න ඕන. මහින්ද රාජපක්ෂ කියන්නේ ජනතාවට කීකරු, බාහිර බලවේගවලට අකීකරු පුත්‍රයෙක්. නමුත් දැන් රට කරන්නේ ජනතාවට හැර බාහිර බලවේග හැමෝටම කීකරු පුත්‍රයෝ. දැන් අපි තීරණය කරන්න ඕනේ හැමෝටම කීකරු කට්ටියද අපිව පාලනය කරන්න ඕනෙ එහෙම නැත්නම් රාවණාගේ සිට පුරන්දරප්පු දක්වා ඒ ශ්‍රේෂ්ඨ සම්ප්‍රදායේ ආදරවන්තයන් වන අකීකරු පුත්‍රයන්ද අපිව පාලනය කළ යුත්තේ කියලා. අපිට තව එක අවස්ථාවක් තිබෙනවා ඒ නියම අකීකරු පුත්‍රයා වුණු මහින්දව බලයට ගෙන එන්න.

ඕනෑම රටක 2/3කට වඩා බහුතරයක් යම් කිසි ජාතිකත්වයක්, ප්‍රජාවක් සිටිනවා නම්, ඔවුන්ගේ භාෂාව සංස්කෘතිය අනෙක් සුළු ජාතීන්ට සංහාවයෙන්ම හිමි වෙනවා. ඒ වගේම ඒ බහුතර ප්‍රජාව එම රට පාලනය කිරීමට ස්වභාවයෙන් උරුමකම් දක්වනවා. එහි අදහස අනෙක් ජාතීන් පීඩිතයෝ වෙනවා කියන එක නොවෙයි. ඒත් ලංකාවේ ගාමක බලවේගය වන්නේ සිංහල ජනතාව.අපට ඒකීය රටක් අත්‍යාවශ්‍යයි.

මෙදා සැරේ මහමැතිවරණය තුළ රනිල් මහින්දල කියන එක පමණක් නොවෙයි ෆෙඩරල් රාජ්‍යයක්ද ඒකීය රාජ්‍යයක්ද කියන ප්‍රශ්නයත් ඉස්මතු වෙනවා. එසේම අපේ ව්‍යංගකතාව ඉරණම ආදී සියල්ල බටහිර බලවතුන්ගේ සැලැස්මට අනුව තීන්දු වෙන්න ඉඩ කඩ දෙනවාද? අපේ අභ්‍යන්තර ප්‍රශ්න විසඳීම සඳහා ඔවුන්ගේ නිර්දේශවලට යටත් වෙනවාද? මේ පාතුවීයේ පැරණිම ජාතියක් දෙස පව තින අපි තවදුරටත් රැකෙනවාද? කියන ගැටලුත් අප ඉදිරියේ පැන නඟිනවා. මේ සියල්ලම වෙනස් කිරීමට තිබෙන අවසන් අවස්ථාව එළඹෙන මහමැතිවරණය බව අවධාරණය කරමින් මම නිහඬ වෙනවා.

(2015 ජුනි 8 වැනි දින කොළඹදී පැවැත්වූ දේශනයක් ඇසුරිනි.)

සටහන - ජීවන්ත ජයතිස්ස

මෙගා බොරු, මෙගා මිත්‍යා සහ යහපාලන ආලාපාවිච

ජනපතිවරණ වේදිකා දෙවනත් කළ බොරුවලින් ටිකක්

1948 සිට 2005 දක්වා මේ රට පාලනය කළ සියලු ආණ්ඩු කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවලට වඩා වැඩි අති දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණයක් 2005-2015 දක්වා මහින්ද රාජපක්ෂ පාලනය සමය තුළ රටට ලැබිණි. රටට නව ජාත්‍යන්තර වරායක්, නව ජාත්‍යන්තර ගුවන් තොටුපලක්, අධිවේගී මාර්ග පද්ධතියක්, ජාත්‍යන්තර මට්ටමේ නෙළුම් පොකුණ රංග ශාලාව, ගුවන් පාලම්, නෙළුම් කුළුණ, ඈත ගම් දනව් දක්වා කාපට් ඇතිරූ මාර්ග, උතුර-දකුණ යා කළ දුම්රිය මාර්ගය, මහින්දෝදය විද්‍යාගාර, පෝර්ට් සිටී ව්‍යාපෘතිය, දැඳුරු ඔය සංවර්ධන යෝජනා ක්‍රමය, මොරගහකන්ද සහ රඹකැන් ඔය ජල යෝජනා ක්‍රම, දක්ෂිණ වරාය සංවර්ධන ව්‍යාපෘතිය, සුන්දර නගර, උද්‍යානයන, ගමන් පථ, වෙළෙඳ සංකීර්ණ, දික්ඔවිට ආදී නව සංවර්ධන ධීවර වරාය ආදී යෝධ සංවර්ධන ව්‍යාපෘති රැසක් මීට අයත්ය.

ලෝක බැංකු වාර්තා අනුව 2005-2015 කාලය තුළ රටේ දළ දේශීය නිෂ්පාදිතය ඇ.ඩො. බිලියන 24.4 සිට ඇ. ඩො. බිලියන 74.9 දක්වා ඉහළ ගොස් තිබූ අතර රටේ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් 96% සිට 75% දක්වා පහත වැටී තිබිණි. 10%ක් ව පැවති උද්ධමනය 5% දක්වා පහත වැටුණු අතර ඒක පුද්ගල ආදායම ඇ. ඩො. 1210 සිට ඇ. ඩො. 3400 දක්වාද, ආර්ථික වර්ධන වේගය 6% සිට 7% දක්වා ද ඉහළ ගොස් තිබිණි.

සොරකම

කෙසේ වුවද මේ දැවැන්ත නැතහොත් මෙගා සංවර්ධන ව්‍යාපෘති රට පුරා ක්‍රියාත්මක කරනුයේ සංවර්ධනයට මුවා වී රට ණය උගුලේ සිර කරමින් ජනතා මුදල් කොල්ල කෑමට යැයි රාජපක්ෂ ආණ්ඩුවට චෝදනා එල්ල විය. කෙන්යාවේ අධිවේගී මාර්ග කිලෝ මීටරයකට වියදම ලංකා මුදලින් රුපියල් මිලියන 2.7ක් වන විට ලංකාවේ එය රුපියල් මිලියන 7.1ක් වන්නේ අධිවේගී මාර්ගය රහිත සඳන නිසා දැයි ඒජාපය, ජවිපෙ සහ හෙළ උරුමය ප්‍රධාන එවක විපක්ෂය විමසා සිටියේ ය. මෙපෙස සියලු සංවර්ධන ව්‍යාපෘති ඔස්සේ වංචා කළ මුදල් රාජපක්ෂවරු විදෙස් බැංකුවල සඟවා, විදෙස් රටවල මාළිගා මිලට ගෙන ඇති බවද පැවසිණි. මහින්ද රාජපක්ෂ පවුලේ සාමාජිකයන්ට හෙලිකොප්ටර් හයක් ඇති බවද දරුවන්ට ලොව වටිනාම මෝටර් රථ වර්ගයක් වන ලැම්බෝගිනි ඇති බවද ඔවුන්ගේ පෙම්වතියන් උදෑසන හෙලිකොප්ටරයෙන් නුවරඑළියට ගොස් ඇමරිකාවේ බකිංහෑම් මාලිගාවෙන් ගෙන ආ රත්තරන් අශ්වයින් පැද දහවල් කෑමට නැවත ගුවනින් කොළඹ එන බවද පැසිණි. රට පුරා මහින්ද මාළිගා තනන බවට කටකතා පතුරුවා හැරිණි. මහින්ද රාජපක්ෂගේ වාර්ෂික වියදම රුපියල් කෝටි 10000ක් බව පැවසුන අතර මහින්ද රාජපක්ෂ පොද්ගලික පරිහරණය සඳහා ගුවන් යානයක් ඇතුළුම් කර ඇති බවටද චෝදනා කෙරිණි. තමන්ට බලය ලබා දුනහොත් මේ සියලු දුෂණ නතර කොට, සංවර්ධනය දහ ගුණයක් වේගවත් කොට, සොරුන් අල්ලා දඬුවම් කරන බවද යහපාලනයක් උදා කරන බවද පැවසිණි. මහින්දගේ ආණ්ඩුව එය තර්ජනයක් සේ නොගත් අතර රට නිසි ප්‍රතිචාර දැක්වීමටද උත්සාහ නො කළේය. එහෙත් එවකට පැවති විපක්ෂය දිගින් දිගට ම මේ චෝදනා නැවත නැවත එල්ල කළ අතර අතිශයෝක්තියට නැංවූ එම පුවත් දකුණේ ගම්දනව් දක්වා අත්තටු ලැබ පාවී ගියේ ය.

තිත්ත ඇත්ත

මේ වන විට යහ පාලන ආණ්ඩුව දින සියයද සමග මාස හයක් රට පාලනය කර තිබේ. පොරොන්දු වූ පරිදි සංවර්ධනය දස ගුණයකින් වැඩි වනු වෙනුවට මුළමනින්ම ඇහෙනිට තිබේ. ආර්ථික සංවර්ධන වේගය 7% සිට 6.4% පහත බැස ඇත. විදේශ සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 9 සිට ඇ.ඩො. බිලියන 6.3 දක්වා පහත වැටී ඇති අතර රාජ්‍ය ණය ප්‍රමාණය බිලියන 850 සිට බිලියන 1250 දක්වා ඉහළ නැඟ ඇත. අයවැය හිඟය 6.5% සිට 9.5% දක්වා ඉහළ යන අතර රුපියල් 131කට මිලට ගත හැකිව තිබුණු ඇමරිකානු ඩොලරයක වටිනාකම රුපියල් 140 කි. එනම් රුපියලේ මිල ඒ ගැනීමේ හැකියාව පහත වැටී තිබේ. එපමණක් නොව 2015 වසර සඳහා අයවැයෙන් රජයට ගැනීම සඳහා අනුමත කර ඇති රුපියල් ට්‍රිලියන 7.8ක් වන දෙස් විදෙස් ණය ප්‍රමාණයෙන් රුපියල් ට්‍රිලියන 7.71 හෙවත් 96%ක වසරේ මුල් කාර්තුව එනම් මුල් මාස හතර තුළ ලබා ගෙන ඇති අතර ඉදිරි මාස අට සඳහා ඇත්තේ අනුමත ණය ප්‍රමාණයෙන් 4%ක් පමණි. මේ අනුව වසර අවසාන වන විට අයවැයෙන් අනුමත ණය ප්‍රමාණය මෙන් තුන් ගුණයක් එනම් රුපියල් ට්‍රිලියන 23 ඉක්මවූ ණය බරක් රටේ ජනතාව මත පැටවෙනු ඇත. මේ සියලු වියදම් රටේ සියලු සංවර්ධන ව්‍යාපෘති නතර කර පරිහෝජනය සඳහා පමණක් වැය කෙරේ.

මෙගා බිල් මිත්‍යාව

අධිවේගී මාර්ග කිලෝ මීටරයක් ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 7.1ක් වැය වන්නේ මන්දැයි ප්‍රශ්න කළ යහපාලකයෝ අද කඩවත කෙරවලපිටිය අධිවේගී මාර්ගයේ කිලෝ මීටරයක් ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 7.5ක් හෙවත් ඉතිහාසයේ ඒ සඳහා වූ වැඩිම මුදල වැය කිරීම වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර තිබේ. ඒ අනුව රාජපක්ෂ රජය වියදම් කළ මිලියන 7.1 ඔස්සේ ගසා කෑ මුදලට වඩා වැඩි මුදලක් මිලියන 7.5 ඔස්සේ යහපාලන ආණ්ඩු ගසා කෑ බව ඔවුන් පිළිගත යුතු ය.

සොරුන්ට දඬුවම් ලබා දෙන පැවසුවද එවැනි කිසිවෙකු වැරදිකරුවෙකු කිරීමට තබා පිළිගත හැකි දූෂණ චෝදනාවක් නැඟීමට පවා යහපාලන රෙජීමය අසමත් වී තිබේ. මෙගා මාධ්‍ය සංදර්ශන පවත්වමින් ඇහැම් ඇමතිවරුන් අත් අඩංගුවට ගත්තේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගිය නිලධාරීන්ට භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන තුරු කැබිනට් අනුමැතියද සහිතව දිවි නැගුම අරමුදලින් වන්දි ගෙවීම, ගං වතුර ආපදාව අවස්ථාවේ අවතැන් ජනතාවට බෙදා දීම සඳහා සමොසෙන් රුපියල් ලක්ෂ 50ක ණයට බඩු ගැනීම වැනි චෝදනාවලට ය. අධිකරණය හමුවට එම මුදල් ගෙවා දැමූ බවට සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් වීම සමග මේ චෝදනා හුදු ද්වේෂ සහගත දේශපාලන පලිගැනීම් පමණක් බව අනාවරණය විය. විමල් වීරවංශට එරෙහිව නැගූ චෝදනා සිය දේශපාලන විරුද්ධවාදීන් දඩයම් කිරීම සඳහාම අවසා ගත් නීති විරෝධී "මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය" තුළම නිෂ්ප්‍රභ වීම ය.

ජනාධිපතිවරණ සමයේ වේදිකාවල ඉගිල ගිය රාජපක්ෂලාගේ හෙලිකොප්ටර්, ලැම්බෝගිනි, මාළිගා, විදෙස් බැංකුවල මුදල් තැන්පතු ආදී සියල්ල බොරු සහ බොරුම පමණක් බව දැන් අනාවරණය වී තිබේ. රට පුරා ඉදි කළ තරු පන්තියේ හෝටල් මහින්දගේ මාළිගා යැයි ප්‍රචාරය කර තිබිණි. ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින්ට හිමි විදෙස් රටවල හෝටල් මහින්දගේ බවට කටකතා පතුරුවා තිබිණි. මේ සියල්ල නොව එකක් සතය නම් එය ජනතාව හමුවේ සනාථ කිරීම සඳහා වරදකරුවන් නීතිය හමුවට ගෙන ඒම සඳහා මාස 6ක කාලය ගොඩට ම ප්‍රමාණවත් ය. එහෙත් ඒ කිසිවක් සිදු නොවූ අතර මේ වන විට රාජ්‍ය මාධ්‍යය ද හාවිත කරමින් තව තවත් මෙගා බොරුවලින් ජනතාව නිරවිඳන්දය කරමින් සිටී.

යාපනයේ පාසල් දැරියක දූෂණය කළේ මහින්දගේ සගයෙකු බවට එජාප නිල Face Book පිටුව ඔස්සේ චෝදනා කළ අතර එය බොරුවක් බව අනාවරණය වුවද නිවැරදි කළේ නැත. මහින්ද ආණ්ඩුවට එතනොල් ගෙන්වන බවට චෝදනා කළ ඇය යහපාලන රෙජීමය පිහිටුවා මාස 6ක් තුළ අලුතින් එතනෝල් ආනයන බලපත්‍ර 26ක් ලබා දී එතනෝල් මිලි ලීටර් ලක්ෂ 13.9ක් රටට ගෙන්වා තිබේ. එහෙත් 2014 වසර තුළ රටට ගෙන්වා ඇති මුළු එතනෝල් ප්‍රමාණය මිලි ලීටර් ලක්ෂ 14.7කි. මීට පෙර බලපත්‍ර 21ක් එනම් වැඩිම එතනෝල් බලපත්‍ර ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ ප්‍රේමදාස පාලන සමයේ දී ය.

මාගම්පුර වරායට නැව් නො පැමිණෙන බව කි යහපාලන රජය පසුගිය දා එහි දෙවැනි අදියර විවෘත කළේ සිය චෝදනාව පුස්සක් බව සනාථ කරමිනි. මහින්ද රජයේ විදේශ ගමන් වියදම් පිළිබඳ කතා කර බලය දිනා ගත් යහ පාලන රෙජීමයේ ඇමති කෙනෙකු සහ පුතෙකු දින 100 තුළ විදේශ සංචාර සඳහා රජයේ මුදල් රුපියල් කෝටියක් පමණ වියදම් කර ඇතැයි මාධ්‍ය වාර්තා කර තිබිණි. මහින්ද රාජපක්ෂ මහතාගේ වාර්ෂික වියදම් ලෙස විපක්ෂය ජනතාව ඉදිරිපත් කර තිබුණේ ජනාධිපතිවරයා යටතේ පැවති සියලු ආයතනවල වාර්ෂික වියදම් වූ රුපියල් කෝටි 9593 වූ අතර එම ආයතන ජනාධිපතිවරයාගෙන් ඉවත් කර අදාළ වැය ශීර්ෂ ද වෙන වෙන අමාත්‍යංශවලට පවරා ජනාධිපති වියදම රුපියල් කෝටි 256 දක්වා ම අඩු කළේ යැයි යහපාලන රෙජීමය උත්‍රාවලෙන් කීවේ රටම හිනස්සවමිනි.

එජාප මන්ත්‍රී නලීන් බණ්ඩාර මාධ්‍ය හමුවක පවත්වමින් රාජපක්ෂලාගේ උදේ කෑම වේලක වියදම රුපියල් ලක්ෂ 94ක් වන්නේ යැයි බිල්පතක් ප්‍රදර්ශන කරමින් චෝදනා කළ අතර ඒ බිලෙහිම ඉහළ කෙළවරේ එය රාජ්‍ය නායකයින් සහ නිලධාරීන් 1400ක් පමණ සහභාගී වූ පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව පැවති දින උදැසන කෑම සඳහා වියදම් බව සඳහන්ව තිබිණි. මේ අතර යහපාලන රෙජීමයේ විදේශ ඇමති මංගල සමරවීර මාධ්‍ය හමුවක් පවත්වමින් රාජපක්ෂ පවුලේ විදෙස් වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 18ක් එනම් ට්‍රිලියන 3.2ක් බවට විදේශ බුද්ධි අංශ තමන්ට තොරතුරු සපයා ඇතැයි කීවේ ය. පසුගිය වසර 10 තුළ මේ රටට ලැබුණු සියලු ආයෝජන සහ ණය ප්‍රමාණයද මෙලෙස හොරකම් කළේ යැයි කියන මුලුලට වඩා බෙහෙවින් අඩු වීමෙන් මෙයද සුපුරුදු මෙගා බොරුවක් පමණක් නොව රටේ විදේශ ඇමතිවරයාට තොරතුරු සපයන බුද්ධි අංශද බිරියන සහ ට්‍රිලියන මොනවා දැයි නොදන්නා බවද මෙම ප්‍රකාශයෙන් පෙළි විය.

සිය හොරකම බොරුවෙන් වැසීම

යහපාලනය උදාකරන බව පවසා බිහි කර ගත් යහ පාලන ආණ්ඩුවේ භාණ්ඩාගාර මගඩිය නිසා රටට සිදු පාවුව රුපියල් කෝටි 60000ට ආසන්න වෙමින් පවතින බව ආර්ථික විශ්ලේෂකයින් පවසන විට ඊට එරෙහිව නැගෙන විරෝසහභාගය යටතේ කිරීම සඳහා තමන් පාර්ලිමේන්තුව විසුරුවා හැරි බව ජනාධිපති සිරිසේන මහතා රට අමතා ගාම්භීර ලෙස ප්‍රකාශ කර සිටියේ ය. එපමණක් නොව ජනතාවගේ නොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කරන බව පවසා බලයට පැමිණි යහපාලන රෙජීමය භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ කෝප් වාර්තාව මහජනතාව අතරට යාම වළක්වනු වස් අධිකරණ වාරණ නියෝගයක්ද ලබා ගත්තේය.

කෙලෙස් අවුලන මැතිවරණ ව්‍යාපාරය

මේ අනුව යහ පාලනය යනු අනෙකක් නොව බොරුවට, වංචාවට, දූෂණයට පර්යාය පදයක් ලෙස මේ රෙජීමය හාවිත කරන බව පැහැදිලිය. ජනවාරි 08 වෙනිදා දක්වා ප්‍රකාශ කළ චෝදනා බොරු බව ජනතාව පසක් කර ගන්නා විට ඔවුන්ට වැරදි තීරණයක් ගෙන අවසන්ය. එහෙත් යහපාලන රෙජීමය කරනුයේ ජනවාරි 08 වෙනිදා දක්වා කී බොරු මත තව තවත් බොරු ගොඩ ගසමින් ජනතාව නිරවිඳන්දය කර රටේ බලය ඛැඟැ ගැනීම සඳහා ක්‍රියා කිරීම ය. රනිල් වික්‍රමසිංහ මහතා ඇමරිකාවට ගොස් මහින්ද පරාජය කිරීමට ඉගෙන ගෙන පැමිණි බව කියන තියරිය මේ මොහා කරුවු මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය විය යුතු ය. පෘථග්ජන මිනිසා තුළ ඊර්ෂ්‍යාව බව, වෛරය, කෝපය, රාගය ඇවිළවීම ඉතා පහසු ය. අපහසු ඒවා මැඬලීම ය. තමන්ගේ මුදලින් අනෙකා සූරාසැප විඳී යන අදහස ජනතාව තුළට කිදා බස්සවා ඔවුන් තුළ වෛරී හාවය හැඟීම මතු කිරීම ඉතා පහසු ය. අපේ ආගමික සංස්කෘතික හර පද්ධති විසින් පිළිකුලින් ප්‍රතික්ෂේප කරන මේ පහත් සිතුවිලි ජනතාව තුළ ව්‍යාප්ත කර ප්‍රතිචාදීයා පරාජය කිරීම යහපාලන රෙජීමයේ උපාය වී තිබේ. ගණිකා වෘත්තිය ජීවිකාව කරගත් ගැහැනියක සිය අග පසඟ ප්‍රදර්ශනය කර මිනිසුන්ගේ හැඟීම් කුපිප කර තමන් වෙත ආකර්ෂණය කර ගැනීම සහ මේ මෙගා බොරු මැතිවරණ ව්‍යාපාරය අතර අතර කිසිදු වෙනසක් නැත. කෙසේ වුවද ජනතාව මෙගා බොරුවලින් රවටා වෛරය, ඊර්ෂ්‍යාව නමැති ලෝ දියෙහි ගිල්වා රට දෙකඩ කොට රැලකි තිර්මාණය කිරීමට දරන නිවට සටකපට උත්සාහය පරාජය කළ යුතුය.

නාමල් උඩලමත්ත

රම වනසන විකල්ප තක්කඩියන්ගේ භූමිකාව

"නමුත් ඉංග්‍රීසීන්ගේ නුවණින් සහ දක්ෂකම්නුත් කැරලිවලට මුල් කාරයෝව සිටියවුන්ගෙන් එක එකා අල්ලා ගත් බැවින් එඩේරෙක් නැති බැටලු රැලවල් මෙන් කැරළිවලට බැඳී සිටි අයවල් මංමුලාව ගියාය. මින්පසු නැවතත් සෑර් රොබට්ස් බුවුන්රිග් උතුමාණන් වහන්සේ සහ සිංහල මනුෂ්‍යයන් අතරේ අලුත් ගිවිසුමක් ඇති කරගත් නිසා ප්‍රථම තිබි ලෙසටම සමාදානය පැතිරී ගියාය. මෙවක් පටන් අදවන තුරුම ඉංග්‍රීසිවරු යටතේ බොහෝ යස ඉසුරුමත් කමකින් සහ ඉතා සමාදානයෙන්ද ලංකාව පවතිනවාය. සීලාචාරකම් දියුණුවිම්ද පාරවල් ආදිය සෑදීමට පදිංචිකාරයන්ගේ සුබ සිද්ධිය ඉශ්ඨ කරදීමට ඕනෑ කරන සියලු දේවල්ම ආණ්ඩුව විසින් ඉෂ්ට කරදී තිබෙනවාය."

ජෝන් පෙරේරා
ක්‍රි.ව. 1853දී නිකුත් වූ ශාස්ත්‍රාලංකාරය සඟරාවෙනි.

අතීතයේදී සුද්දා මේ රට සෘජුව යටත් කරගෙන තලා පෙලා පාලනය කරන කාලයේ සිටම සුද්දා වෙනුවෙන් මතවාද සකස්කළ උගත්තු හා පඬියෝ රැසක් මෙරට වූහ. ඉංග්‍රීසි වරප්‍රසාද හරහා උගතුන්ගේ වෙස් ගත් මේ පිරිසේ කාර්යය හාරය වූයේ සිංහල බෞද්ධ සංස්කෘතියට, දේශීය සම්ප්‍රදායන්ට, බුදු දහමට අවමන් කරමින් සුද්දන්ගේ යටත්විජිත කොල්ලයට මතවාදී පහසුකම් සපයාදීමය. ඔවුන් සුද්දා ළඟුවේ අප කෙරේ වූ කරුණාවෙන් අපේ පසුගාමී නොදියුණු රටවල් ශිෂ්ඨ කිරීමට පැමිණි පිරිසක් ලෙසය. ඉහත දක්වා ඇත්තේ ඒ වර්ගයේ උගතෙකු විසින් ලියූ සටහනකි. එකළ බිහිවූ පුවත්පත් සඟරා සෑම එකකම පාහේ විජාතික හා ජාතික බලවේග අතර මේ ගැටුම තියුණුව දක්නට ලැබිණි.

අද සුද්දා සෘජුව මේ රට පාලනය නොකළද බටහිර යටත්විජිතවාදය අද්‍ය මේ පොළවේ ක්‍රියාත්මක වන්නකි. එදාට වඩා බොහෝ දියුණු තියුණු උපක්‍රම හා විසිතුරු මුහුණු ඔස්සේ යටත්විජිතවාදය වෙනුවෙන් පෙනී සිටින උගතුන්, කලාකරුවන්, ලේඛකයන්, මාධ්‍යවේදීන් රාශියක් මේ මොහොතේද අප අතර සිටිති. සාමාන්‍ය හවෙරිදි සිවිල් සමාජය, සමාජ ක්‍රියාකාරීන්, විකල්ප බුද්ධිමතුන් ආදී නම්වලින් ඔවුහු තමන්ව හඳුන්වා ගන්නා අතර පසුගිය මැතිවරණයේදී පුරවැසි බලය, අලුත් පරපුර, විදේශ විරෝධය ආදී සංවිධාන ඔස්සේ මහා යහපාලන වංචාව වෙනුවෙන් පෙනී සිටි මේ පිරිස මෙවර මැතිවරණයේදී මහින්දට එරෙහිව කඳවුරු බඳිමින් සිටිති. අද මොවුන්ගේ මූලික කාර්යය වී ඇත්තේ රනිල් දිනවිය යුතු බව නොකියා කිම සඳහා "මහින්ද එපා" "ජනවාරි අට විප්ලවය සුරකිමු" "ජනවරම පාවා නොදෙමු" ආදී සෝබනකාර සටන්පාඨ කිපයක් ඔසවාගෙන යාමය. ඒ සඳහා බිත්තියට හේත්තු වී සිටින මෛත්‍රීපාල සහ බොරු විප්ලව කතාවලට මුවාවී 2004 නතර වූ රනිල්ගේ ගමනට පණ දීමට මොවුහු කැස කවමින් සිටින අතර, මේ පිරිස කවුදැයි හඳුනාගැනීම කාලීන උවමනාවක් වන්නේ ඒ නිසාය.

මෙකී විකල්ප ක්‍රියාකාරිත්වය බොහෝ දුරට රනියා මතවාදී ලෝකය ආඥය කර ගත්තකි. පොදු සමාජය තුළ නැතත් රටේ මතවාදී සමාජය තුළ ඔවුන්ට කිසියම් ආධිපත්‍යයක් තිබේ. මේ ආධිපත්‍යය රාවය වැනි පුවත්පත්, වාර සඟරා, වෙබ් අඩවි, සංවාද, සම්මන්ත්‍රණ හා කොළඹ මැදි කර ගත් විවිධාකාර වැඩසටහන් ඔස්සේ ව්‍යාප්ත වෙස ගොඩනඟා ගත්තකි. නොතේරෙන බසින් ලියන විචාරකයන්, රටට ගරහා සම්මාන උපයන සිනමා කරුවන්, එක්සත් ජාතීන්ට කේලාම් කියන ත්‍රී රෝද වාමාංශිකයන්, මොද්දක් හැඳි ගා ගන්නට නොදත් ස්ත්‍රීවාදීනියන් ආදී නාටකීය චරිත රැසක් මේ ගෝත්‍රයට අයත්ය. රටේ කිසිදු වැදගත් ප්‍රශ්නයක් පිටපි සිහිගියන් විග්‍රහ කර ගැනීමට ඔවුන්ට හැකියාවක් නැතත් සාමාන්‍ය මිනිසුන් ඉදිරියේ බුද්ධිමය වේශයක් මවාපෑමට ඔවුන්ට හැකිව තිබේ. ඔවුන් බොහෝ විට රැඩිකල් හා වාමාංශික මුහුණක් පෙන්වුවද ඔවුන් බොහෝදෙනකුගේ පැවැත්ම දළිත එන්ජීඕ සංවිධාන ආදිය මත රඳා පවතින්නකි. එය ඔවුන්ට නිල හා නොනිල වශයෙන් අති විශාල ආර්ථික වාසි හා සැප සම්පත් උපයා ගත හැකි ක්ෂේත්‍රයක් වෙයි. එන්ජීඕ සංවිධාන සමඟ නිල සම්බන්ධතා ඇතැත් නැතත් මේ සියලු දෙනා මතවාදීමය වශයෙන් එන්ජීඕ තුස්තවාදය සමඟ මැනවින් සම්පාත වෙති. මතවාදීමය වශයෙන් විශාල විවිධත්වයක් මේ ගෝත්‍රය තුළ දක්නට ලැබුණද ඒ විවිධ මතවාද සියල්ල හරයාත්මක වශයෙන් එක සමානය. සැකෙවින් සලකා බලතොත් ඔවුන්ගේ මතවාදවල මූලික පොදු ලක්ෂණ මෙසේ පිඬු කළ හැකිය.

- **වදා සිටම අතිශය පක්ෂග්‍රාහී ලෙස කොටි තුස්තවාදය වෙනුවෙන් පෙනී සිටීම**
- **කොටි පරදවා රටට සාමය උදාකළ බලවේග සහ රණවිරුවන් සමඟ මාරාන්තික වෛරයකින් පසුවීම**
- **මේ රටේ ඉතිහාසය, සංස්කෘතිය, බුදු සසුන, ජාතික වටිනාකම් සහ හර පද්ධතීන්ට පහර දෙමින් සමාජ පාඳඩකරණයට දායකත්වය සැපයීම.**
- **බටහිර අධිරාජ්‍යවාදයෙන් අප වැනි නොවැදගත් රටවලට කිසිදු තර්ජනයක් නොමැති බව සහ එය හුදු මවා පෙන්වන බිල්ලෙක්, මිත්‍යාවක් බව විවිධ ක්‍රමෝපායන් ඔස්සේ නිතර නිතර අවධාරණය කිරීම.**
- **සිංහල බෞද්ධ සංස්කෘතිය කෙරේ උතුරා හැලෙන වෛරයකින් පසුවීම.**
- **ජාතිවාදයට එරෙහි වීමේ නාමයෙන් සිංහල බෞද්ධ සංස්කෘතියට පහර දෙන අතරේ කොටි තුස්තවාදය හා මුස්ලිම් අන්තවාදය වැනි අන්ත මිලේච්ඡ ජාතිවාදී ප්‍රවණතා සාධාරණීකරණය කිරීම.**
- **කිසිදු අධ්‍යාත්මයකින්, ලෝකය පිළිබඳ ආදරයකින් තොර, යථාර්ථවාදයට පහසුවෙන් හිලෑ කරගත හැකි නරුමවාදී බාල නිස්සාර පරපුරක් තැනීම අරමුණු කරගත් කලා සාහිත්‍ය හා ශාස්ත්‍රීය කටිකාවක් ගොඩනැඟීම.**
- **මතුපිටින් වාමාංශික මාක්ස්වාදී හා පශ්චාත් නූතනවාදී ප්‍රජාතන්ත්‍රවාදී වෙස් මවා පෙන්වුවද ක්‍රියාවෙන් කොන්දේසි විරහිතව බටහිර යටත්විජිතවාදයට සේවය කිරීම හා එහි දේශීය නියෝජිතයා වන රනිල් වික්‍රමසිංහ වෙනුවෙන් සෘජුව හෝ වක්‍රව පෙනී සිටීම.**

ජනවාරි අට වැනිදායින් පසු අද වන විට මේ පිරිසට කවදාකවත් නොතිබූ තරමේ රාජ්‍ය අනුග්‍රහයක්ද හිමිව තිබේ. අද රජයේ මාධ්‍ය ආයතන හසුරුවනු ලබන්නේ මද්දුම බණ්ඩාර හූප්ජ කොල්ලෙක් බව කියමින් කෑ මොර දෙන හූප්ජ කොල්ලන්ගේ අමනෝඥ නාත්තලා වන සන්නස්ගලලා විසිනි. අද ගම්වල පාසැල්වල සාහිත්‍ය උත්සව සංවිධානය කරනු ලබන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැනි එන්ජීඕ සංවිධාන විසිනි. ඒ පිළිබඳ කව බොහෝ උදාහරණ පෙන්වා දිය හැකි වන අතර මේ තත්ත්වය රටට හෝ මනුෂ්‍යත්වයට ගරුකරන කිසිවෙකුට කිසිසේත්ම ලුහුබැකොට නැකිය හැක්කක් නොවේ. මහින්දගේ පාලනය තුළ කුමන දුර්වලතා පැවතියද රනියා යහපාලනය යටතේ එන්ජීඕ තුස්තවාදය බලවත් කිරීම ඒ කිසිවකට හිලවී කළ නොහැකි සාපරාධයකි. මහින්ද වටා එක්වී සිටි විශ්වීම කාරයන්ට වඩා රනිල් වටා එක්වී සිටින හොර උගතුන්ගේ භූමිකාව රටට බෙහෙවින් හානිකර බව අප විසින් තේරුම් ගත යුතුව තිබේ.

මේ ලිපිය අවසාන කිරීම සඳහා දක්වන පහත උපුටනය එන්ජීඕ සංවිධාන සමඟ වැඩ කර අන්දැකීම් ඇති බව කියන, සමාජවාදය ගැන කියමින් රනිල් දිනවීම සඳහා අනියමින් පෙනී සිටින, අජිත් පැරකුම් ජයසිංහ විසින් ඔහුගේ w3 lanka බෙබ් අඩවියට ලියන ලද සටහනකි. රට වනසන රනිල්ගේ බුද්ධිමය මාෆියාවේ තිරය පිටුපස කාරණා කෙබඳු දැයි හඳුනාගැනීම සඳහා එය බෙහෙවින් වැදගත්ය.

"රාජ්‍ය නොවන සංවිධාන වෙනුවෙන් පෙනී සිටීමට බැරි හිරිකිතයක් දීර්ඝ කාලීන සමාජ ක්‍රියාකාරකයෙකු ලෙස රාජ්‍ය නොවන සංවිධාන ඇසුරු කළ අයකු ලෙස මට තිබේ. රාජ්‍ය නොවන සංවිධාන තුළ තරමී ඡාති සංඝන පවුල්වාදයන් කට්ටිවාදයන් රාජපක්ෂ පවුලේ හෝ ආණ්ඩුවේවත් නැත. රාජ්‍ය නොවන සංවිධාන තරම් වැඩසටහම් ස්වාමී සේවක සම්බන්ධතා පැරණි වළිවලවත් නැත. රාජ්‍ය නොවන සංවිධාන තරම් දූමිත මුදල් ගනුදෙනු මුදල් අමාත්‍යාංශයේවත් නැත. රජ පැටවිවත් රාජ්‍ය නොවන සංවිධාන තරම් මහජන මුදල් නාස්ති කරන්නේ නැත. රාජ්‍ය නොවන සංවිධානවල තරම් අඩුවෙන් වැඩ කර වැඩියෙන් පබ ගන්නා සේවකයන් ඇමති කාර්යය මණ්ඩලවලවත් නැත. රාජ්‍ය නොවන සංවිධානවලට අරමුදල් රැස්කරන්නේ බොහෝ විට ලංකාව වැනි රටවල සිටින දුප්පතුන් විඤ්ඤාය. එහෙත් ඒ අරමුදල්වලින් වැඩි හරියක් වැය වන්නේ රාජ්‍ය නොවන සංවිධාන නිළධාරීන්ගේ සුබ විහරණය සඳහාය. ලෝක බැංකුවිවත් රාජ්‍ය නොවන සංවිධාන තරම් දුප්පතුන් විඤ්ඤාණයෙන කන්නේ නැත."

මෙකී එන්ජීඕ මාෆියාවෙන් සහ එහි බලපෑමෙන් ඔද්දල් වූ හොර උගතුන්ගෙන් රට ගලවා ගැනීමද අනෝස්තු දාහත් වැනිදා රටට ආදරය කරන මිනිසුන්ට පැවරෙන අනිවාර්ය වගකීමක් බව අවධාරණය කළ යුතුව ඇත.

සුභාෂ් වික්‍රමගේ



රනිල් ගැන බටලන්දෙන් ඇසෙන කතා

බොහෝ දෙනෙකුට අමතක වෙමින් තිබෙන බටලන්ද කොමිසමේ වාර්තාව යනු ව්‍යවස්ථා විරෝධීව බලය ගත් වත්මන් අගමැතිවරයාගේ මානව විරෝධී ස්වභාවය වටහා ගැනීමට ඉවහල් වන වැදගත් ලියවිල්ලකි. මෙම කොමිසම පිහිටුවන ලද්දේ බටලන්දේ වධකාගාරයක් පවත්වාගෙන යාම පිළිබඳ සොයා බැලීම සඳහාය.

බටලන්ද යනු 1988-1989 සමයේ පුද්ගලයන් මර්දනය සඳහා යොදාගත් වධකාගාරයකි. බටලන්දේ පිහිටි රාජ්‍ය පොහොර සංස්ථාවේ නිවාස යෝජනා ක්‍රමයකට අයත් නිවාස 13ක් මෙම වධකාගාරය ස්ථාපිත කිරීම සඳහා භාවිත කර තිබිණි. මෙම නිවාස රනිල් වික්‍රමසිංහ මහතාගේ ආසනය වන බියගම ආසන බල ප්‍රදේශය තුළ පිහිටා තිබේ. 1988 ජනවාරි 1 වැනිදා සිට 1990 දෙසැම්බර් දක්වා කාලය තුළ මෙම වධකාගාරය ක්‍රියාත්මකව පැවති අතර පුද්ගලයන් 100කට වැඩි ප්‍රමාණයක් එහිදී ඝාතනයට ලක් වන්නට ඇතැයි සැලකේ. නීතිඥ විජේදාස ලියනාරච්චි මහතා බටලන්ද වධකාගාරය තුළ ඝාතනයට ලක්වූ ප්‍රකට චරිතයකි. 1994 චන්ද්‍රිකා ජනාධිපතිනිය බලයට පත්වූ පසුව මෙම වධකාගාරය පිළිබඳ සොයා බැලීමට කොමිසමක් පත් කළාය. එම කොමිසම් සභා වාර්තාව පෙන්වා දෙන ආකාරයට පොහොර නිෂ්පාදන සංස්ථාවට අයත් නිවාස 13ක් මෙම වධකාගාරය සඳහා ලබාදෙන ලෙසට එම සංස්ථාවේ ඈවරකරුවූ අශෝක සේනානායක මහතාට නියෝග කර ඇත්තේ එවකට කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ විසිනි. ඔහු විසින් මෙම නිවාස එවකට කළළණිය පොලිස් කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස් මහතාට භාරදී තිබේ. මේ කටයුත්ත සඳහා රනිල් වික්‍රමසිංහ තම අමාත්‍ය බලතල අයථාලෙස භාවිතා කර ඇති බවත්, පොලිසියට මෙම නිවාස පවරා ගෙන ඇත්තේ පොලිස් දෙපාර්තුමේන්තුවේ අවසරයකින් තොරව, එහි ව්‍යවස්ථාවේ පිළිගත් ප්‍රමිතීන්ට පටහැනිව බවත් කොමිසම පෙන්වා දෙයි. රනිල් වික්‍රමසිංහ මහතා නිතර මෙම ස්ථානයට ආගිය බවත්, එහි වූ වධකාගාර පෙනෙන මානයේ වික්‍රමසිංහ මහතාගේ කටයුතු සඳහා වෙනම නිවසක් වෙන්කර තිබූ බවත් කොමිසමේ සඳහන්ය. අවසානයේදී මෙම කොමිසම මගින් වගකිවයුතු පුද්ගලයන්ට ප්‍රජාඅයිතිය අහෝසි කිරීම මට්ටමේ දැඩිවම් පැමිණවීමට නිර්දේශ කළද ජනාධිපතිනිය විසින් කොමිසමේ නිර්දේශ නොසලකා හැරීම නිසා වරදකරුවන්ට නිදහසේ කටයුතු කිරීමට ඉඩ ලැබිණි. අප එම කොමිසමේ කොටස් කීපයක් මෙහි උපුටා දැක්වීමට තීරණය කළේ යහපාලන පියවරුන්ගේ සැබෑ ස්වරූපය නැවත වරක් ඔබට පෙන්වාදීම සඳහාය.

අංක. I දරන සැපි වාර්තාව - 2000

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව.



තවද, එබඳු රැස්වීම් දිනපති කාර්යාලයෙහි පවත්වනු ලැබූ නමුත් ගුණරත්න මහතා සහභාගිවූ වීමඉසිංහ මහතාගේ ඉටුකාන්තරයෙන් පැවැති රැස්වීම් වෙනත් තැන්හිදී පැවැත්වේනි.

මෙම රැස්වීම්වලට තමන් සහභාගිවූ බවට පිළිගත් හවත් පොෂේප් සිල්වාරත්න මූලික සාක්ෂිකාර පොලිස් අධිකාරි රාජා ඩයස් ය. රත්නේ වීමසිංහ මහතාගේ ඉටුකාන්තරයෙන් පැවැති රැස්වීම් නිහිපයකටම තමන් සහභාගී වූ බව පෙනෙන පැවැසිය. මෙම රැස්වීම් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි සිහිවී නිවාස දෙකෙන් පවත්වන්නට ගෙදී ඇත. මින් එකක් රත්නේ වීමසිංහ මහතා පදිංචිව සිටී නිවාසය වූ අතර, අනෙක වූයේ සබරගම බලපාමුව දිස්ත්‍රික්කයේ පිහිටි නිවාසයකි. මෙය පුද්ගලව පිහිටි නිවාසයකි. මෙම පුද්ගල නිවාසයෙහි පැවැති රැස්වීම්වලද වීමසිංහ මහතා මූලසුන දැරිය. මෙම රැස්වීම්වලට සියලෙස පොලිස්පති මෙරේ ඉණ්ඩික, පොෂේප් පොලිස් අධිකාරි තුසිත් දෙමුණාව , සහකාර පොලිස් අධිකාරි වාල්ස් පීරිස් , "පොලිස් පරීක්ෂකවරුන්" වන අසරණිල, රාජින් වීමසිංහ සහ සැලෑති පුද්ගලයෙකු පිහිටි සෙසු පුද්ගලයන් යැයි කියා හැඳින්වූවන් සහභාගී වූහ. වීමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරිවූ මේ පුද්ගලයන් සියලු දෙනාම රැස්වීම්වලට සහභාගී වූ බව සාක්ෂි දරා ඇත.

පිටුව 88

I. 1986 ත් ආරම්භව ව්‍ඩිඩ අධිවවලදී රනිල් වික්‍රමසිංහ මහතා (එම මහතා අදාළ කාලසීමාව තුළදී තැනිනිට අමාත්‍යවරයෙක් වීය.) රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ අදාළ බලධාරීන්ට, එකී සංස්ථාවට අයත් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස කැළණිය පොලිස් කොට්ඨාසයේ පොලිස් නිලධාරීන්ට වෙන්කරනා ලදාදැයි දැනට ඇස හිමාර්ගය.

III. ඉහත සඳහන් නිවාස පොලිස් නිලධාරීන් සඳහා ලබාගැනීමේ කටයුත්ත, සහකාර පොලිස් අධිකාරි වාල්ස් පීරිස් විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ නිවාස වෙන්කිරීම් සඳහා පවත්වාගෙන යන ලද රැස්වීම්වලදී පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහභාගී වූ බවත් පොලිස් දෙපාර්තමේන්තුවේ වෙන්කිරීම් සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ වගකීම පොලිස් අධිකාරි වාල්ස් පීරිස් මහතාට පවරා තිබූ බවත් පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවරා දෙනු ලැබූ නිවාස වෙන්කිරීම් සිදුකර තිබේ. ඒ අනුව පොලිස් අධිකාරි වාල්ස් පීරිස් මහතාගේ බලතල මේ සම්බන්ධයෙන් අසුනු ලෙස පාවිච්චි කර ඇත.

IV. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරුට ඉහත සඳහන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස පොලිස් නිලධාරීන්ට ලබාදීමට නියම කිරීමෙන් රනිල් වික්‍රමසිංහ මහතා කරිමාත්ම අමාත්‍යවරයාගේ තත්ත්වයෙන් වූ මහතාගේ බලතල අසුනු ලෙස පාවිච්චි කර ඇත.

පිටුව 155

ඇමැති වීමසිංහ මහතාට නියෝග කර ඇත්තේ එවකට කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ විසිනි. ඔහු විසින් මෙම නිවාස එවකට කළළණිය පොලිස් කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස් මහතාට භාරදී තිබේ. මේ කටයුත්ත සඳහා රනිල් වික්‍රමසිංහ තම අමාත්‍ය බලතල අයථාලෙස භාවිතා කර ඇති බවත්, පොලිසියට මෙම නිවාස පවරා ගෙන ඇත්තේ පොලිස් දෙපාර්තුමේන්තුවේ අවසරයකින් තොරව, එහි ව්‍යවස්ථාවේ පිළිගත් ප්‍රමිතීන්ට පටහැනිව බවත් කොමිසම පෙන්වා දෙයි. රනිල් වික්‍රමසිංහ මහතා නිතර මෙම ස්ථානයට ආගිය බවත්, එහි වූ වධකාගාර පෙනෙන මානයේ වික්‍රමසිංහ මහතාගේ කටයුතු සඳහා වෙනම නිවසක් වෙන්කර තිබූ බවත් කොමිසමේ සඳහනය. අවසානයේදී මෙම කොමිසම මගින් වගකිවයුතු පුද්ගලයන්ට ප්‍රජාඅයිතිය අහෝසි කිරීම මට්ටමේ දැඩිවම් පැමිණවීමට නිර්දේශ කළද ජනාධිපතිනිය විසින් කොමිසමේ නිර්දේශ නොසලකා හැරීම නිසා වරදකරුවන්ට නිදහසේ කටයුතු කිරීමට ඉඩ ලැබිණි. අප එම කොමිසමේ කොටස් කීපයක් මෙහි උපුටා දැක්වීමට තීරණය කළේ යහපාලන පියවරුන්ගේ සැබෑ ස්වරූපය නැවත වරක් ඔබට පෙන්වාදීම සඳහාය.

පිටුව 42



42 ශ්‍රී ලංකා සැපි වාර්තාව, 2000

V වන පරිච්ඡේදය

ජීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම

පොලිස් නිලධාරීන්ට නිවාස වෙන්කරදීම

ලබාගැනීමට බලාපොරොත්තු වෙමින් සිටි බව සාක්ෂි දරා ඇත. ඒ අනුව, ඔවුන් ඉල්ලුම් කළ නිවාස ලබාදීමට ඔවුන් විසින් නම් කරන ලද නිලධාරීන් පත් කිරීමට ඔවුන් කටයුතු කළ බව පෙනී යයි. ඒ අනුව, ඔවුන් ඉල්ලුම් කළ නිවාස ලබාදීමට ඔවුන් විසින් නම් කරන ලද නිලධාරීන් පත් කිරීමට ඔවුන් කටයුතු කළ බව පෙනී යයි. විත්තිය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි

වෙනස

තීන්දුවට පෙර අවධානයට

රටක් වශයෙන් අප විසින් වෙනස් කරගත යුතු දෑ බොහෝය. එසේ වුවද රටක අඩුපාඩු දුෂ්කරතා පිළිබඳ දුක්ගැනවිලිවල වාසිය රටට සතුරු බලවේග අතට පත්කිරීම අප අතින් සිදු නොවිය යුතු බලවත් වරදකි. අද සිදුව ඇත්තේත් අතීතයේ සිටම රටේ ජයග්‍රහණවලට එරෙහිව කටයුතු කළ දූෂිත බලවේග තමන්ගේ සැබෑ රකුස් මුහුණ සඟවාගැනීම සඳහා ව්‍යාජ යහපාලන වෙස් මුහුණක් ඉස්සර කර ගැනීමය. එසේ වුවද දිනෙන් පතුරු ගැලවී යන මේ යහපාලන වෙස් මුහුණ පිටුපස ඇති සැබෑ රකුස් මුහුණ දැනටමත් රටේ ජනතාව හමුවේ නිරාවරණය වී හමාරය. ජනවාරි 8 වැනිදා සිදු වූ වරද නිවැරදි කරගැනීම සඳහා මේ මොහොතේ අප හමුවේ ඇති එකම හා වඩා සුදුසුම තීරණය වන්නේ එළැඹෙන මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ පෙරටු කරගත් බලවේගය ජයග්‍රහණය කරවීමය. දිනෙන් දින මේ රට ඇදී යමින් තිබෙන විනාශකාරී ගමනට තිත තැබීමේ එකම හා අවසාන විකල්පය එය වෙයි.

- ද්‍රෝහී දේශපාලන බලවේගවල සැබෑ මුහුණුවර හඳුනාගනිමු
- මවුබිමේ සතුරන් අතට පත් වූ තාවකාලික ජයග්‍රහණය ආපසු හරවමු

වරද නිවැරදි කරමු! වෙනස වෙනස් කරමු!!

ඔබේ තීරණය මාතෘ භූමියේ අනාගතයයි

අංක18, රොඩ්නි පෙදෙස, කොටා පාර, බොරැල්ල ලිපිනයේ පදිංචි නිමල් චන්ද්‍රසිරි වන මා විසින් 96/ඒ, වනාත පාර, ගංගොඩවිල, නුගේගොඩ පිහිටි ඉමාෂි ප්‍රින්ටර්ස් ආයතනයේ මුද්‍රණය කර බෙදාහරින ලදි.